// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1933/40 - 2015 සැප්තැම්බර් මස 25 වැනි සිකුරාදා - 2015.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

IV (අ) වැනි කොටස - පළාත් සභා

පළාත් සභා නිවේදන

වයඹ පළාතේ පළාත් සභාව

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ, පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් ම විසින් සම්පාදනය කරනු ලැබූ, පහත දැක්වෙන කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඉහත කී වගන්තිය යටතේ මෙසේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 93 වගන්තිය සහ 126 වන වගන්තියේ IX වන උප වගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවලින්, ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට ප්‍රාදේශීය සභාවට බලය පැවරී ඇති අතර 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ ප්‍රකාර, මෙම සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන වැළඳ ගැනීම සඳහා වයඹ පළාතේ ප්‍රාදේශීය සභාවලට බලය පැවරී ඇත.

නීතිඥ ජේ. පී. දයාසිරි පද්ම කුමාර ජයසේකර,
වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලනය,
මානව සම්පත්, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්, පරිසර, සංචාරක,
ආයෝජන සම්බන්ධීකරණ, සමුපකාර සංවර්ධන සහ ආහාර සැපයුම් හා බෙදා හැරීම් අමාත්‍ය.

2014 දෙසැම්බර් මස 04 වැනි දින,
කුරුණෑගල දී ය.

ප්‍රාදේශීය සභා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ

අතුරු ව්‍යවස්ථාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ලෙස සඳහන් කරනු ලැබේ.

02. ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීථිවල, මංමාවත්වල ජනනය වන ඝණ අපද්‍රව්‍ය වෙන් කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

1A - PG 2613 — 08 (2015/09)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

03. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙකුම හෝ පදිංචිකරුවකුම තම පරිශ්‍රය අපද්‍රව්‍යවලින් තොර සෞඛ්‍ය සම්පන්න හා ප්‍රසන්න තත්වයෙන් තබා ගත යුත්තේ ය.

04. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍රය ඇතුලත ජනනය වන්නාවූ අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන් කිරීම, ගබඩා කිරීම හා බැහැර කිරීම කළ යුත්තේ ය. නැතිනම් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව කළ යුත්තේ ය.

05. (i) පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තම පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ ඝණ අපද්‍රව්‍ය අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයක් භාවිතා කරමින් හෝ දෛනිකව නැතිනම් ඊට වඩා අඩු කාලාන්තරයෙන් එක්රැස් කළ යුත්තේ ය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වගාමී උප වගන්තිය අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය අංක 8 සිට 20 දක්වා වන වගන්තිවල විධිවිධානවලට අනුකූලව වෙන් කළ යුත්තේ ය. නැතිනම් එසේ කිරීමට සැලැස්විය යුත්තේ ය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය ගබඩා කිරීම හෝ මුද හැරීම සඳහා භාවිතා කරනු ලබන යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් බහාලුමක් මෙම අතුරු ව්‍යවස්ථාවේ වගන්තිවල වන කාර්යයන් සඳහා මනා තත්වයෙන් පවත්වා ගත යුතු වේ.

(iv) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 5(I) උප වගන්තියට අනුකූලව එක්රැස් වන කසල භාර ගැනීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් පූර්ව දැනුම් දීමකින් අනතුරුව නිශ්චිත සේවාවක් පවත්වාගෙන යා යුතු අතර එකී (1) වන උප වගන්තියේම සඳහන් ආකාරයට එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සභාව විසින් කලින් කලට තීරණය කර ප්‍රසිද්ධ කරනු ලැබූ සභා බල ප්‍රදේශ තුළ ක්‍රියාත්මක වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ ක්‍රමයට හා කාලසටහනට අනුකූලව හිමිකරු හෝ පදිංචිකරු විසින් භාර දිය යුත්තේ ය.

(v) හිමිකරු හෝ පදිංචිකරු නිවැසියන්ගේ, අමුත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ සෞඛ්‍යයට හෝ එම ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්වයට හානිකර හෝ අන්තරාකාරී වන අන්දමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැර කිරීම නොකළ යුත්තේ ය.

06. (i) කිසිම තැනැත්තෙක් වීථියකට, පාරකට, මංමාවතකට, පටු මාවතකට, මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජල මාර්ගයකට, රක්ෂිතයකට හෝ ජලාශයකට, කළපුවකට, ජල මූලාශ්‍රයකට හෝ මුහුදට අපද්‍රව්‍ය මුදහැරීම නොකළ යුත්තේ ය.

(ii) කිසියම් තැනැත්තෙක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ විවෘත භූමියක පරිසරයට හානිකර වන අන්දමින් අපද්‍රව්‍ය පිළිස්සීම නොකළ යුත්තේ ය.

(iii) යම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් අංක 7 දරන වගන්තියේ විධිවිධාන ප්‍රකාර යම් අපද්‍රව්‍ය වර්ගයක් මුදහැරීම, පිරියම් කිරීම, සැකසීම හෝ බැහැරලීම සඳහා අවසර ලබා ගැනීමට සිදුවන අවස්ථාවකදී එසේ අවසර ගැනීමට අපොහොසත් වේ නම් ඔහුට එම අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) අංක 7 දරන වගන්තියේ විධිවිධාන යටතේ සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම හෝ නොකරනු ලැබූ අපද්‍රව්‍ය ඉහත 6 (iii) හි විධිවිධාන යටතේ යම් බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් කරන ලද යම් අපද්‍රව්‍ය වර්ගයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව ඉවත් කරනු ලැබිය යුත්තේ ය.

07. (i) යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් හැර අපද්‍රව්‍ය එම පරිශ්‍රය ඇතුළත ම බැහැර කළ හැකිය.

(අ) ප්‍රාදේශීය සභාව විසින් එවැනි අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කරන ලද ප්‍රදේශයක් වීම.

(ආ) ප්‍රාදේශීය සභාව විසින් නිශ්චිතව නියම කරනු ලැබ ඇති ඇතැම් අපද්‍රව්‍ය වර්ග

(ii) පරිශ්‍රයේ හිමිකරුට හෝ පදිංචිකරුට ලේකම්වරයා විසින් අනුමත කරන ලද සැලසුමකට හා ප්‍රමිතියකට අනුකූලව ඉදිකරනු ලැබූ දහනයක හෝ පෝරණුවක අපද්‍රව්‍ය පිළිස්සිය හැකිය. නැතිනම් ලේකම්වරයා විසින් අනුමත කරන ලද ආකාරයට අපද්‍රව්‍ය පිරියම් කිරීම, සැකසීම හෝ වැළලීම කළ හැකිය.

(iii) යම් හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු ''කොම්පෝස්ට් බඳුන්'' සඳහා ලේකම්වරයා වෙතින් ඉල්ලීමක් කළහොත් ඒ හිමිකරුට හෝ පදිංචිකරුට එම කොම්පෝස්ට් බඳුන් නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් පරිශ්‍රය තුළ තිබේනම් ලේකම්වරයා එම කොම්පෝස්ට් බඳුන්වල පිරිවැයෙන් කොටසක් හෝ මුළුමනින් හෝ සහනාධාරයක් වශයෙන් ලබාදෙමින් එම කොම්පෝස්ට් බඳුන් හිමිකරුට හෝ පදිංචිකරුට සැපයිය හැකිය.

(iv) හිමිකරු හෝ පදිංචිකරු පරිශ්‍රය ඇතුළත එකතුවන 'ගෙවතු අපද්‍රව්‍ය' හැකිතාක් අදාළ පරිශ්‍රය තුළ මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව බැහැර කිරීමට කටයුතු කළ යුතුය. අනතුරුව ඉතිරිවන යම් ගෙවතු අපද්‍රව්‍යක් වේ නම් එය බැහැරලීමට ඇති අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි නියමිත ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට භාරදිය යුත්තේ ය.

(v) වීථියක හෝ මංමාවතක යාබදව පිහිටි යම් ගසක් හෝ ගසක කොටසක් කපන යම් තැනැත්තෙක් වහාම එය ඉවත් කළ යුත්තේ ය. නැතිනම් ඉවත් කිරීමට සැලැස්විය යුත්තේ ය. එසේත් නැතිනම් ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන ගාස්තු ගෙවීමක් මත ප්‍රාදේශීය සභාව වෙනුවෙන් කසල එක්රැස් කරනු ලබන අයට භාර දිය යුත්තේ ය.

(vi) සෑම තැනැත්තෙක්ම ඔහුගේ පාලනය යටතේ සිටින යම් සතෙකු වීථියක, මංමාවතක හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුත්තේය. එසේ මළපහ කරනු ලැබුවහොත් අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම ඒ තැනැත්තාගේ වගකීම වන්නේ ය.

(vii) කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුමන වර්ගයක හෝ අපද්‍රව්‍යයක් වාහනයක සිට වීථියකට, මංමාවතකට හෝ පොදු ස්ථානයකට, ඇලකට, දෙළකට, ජල මූලාශ්‍රයකට, රක්ෂිතයකට හෝ කළපුවකට මුදාහැරීම හෝ එහි තැන්පත් කිරීම හෝ නොකළ යුත්තේ ය.

(viii) නිවෙසක් හෝ වෙනත් යම් ප්‍රරිශ්‍රයක් ඉදි කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට සැලැස්මක් අනුමත කරවා ගැනීමට අයදුම් කරන යම් කෙනෙක් ඔහුගේ පරිශ්‍රයේ ජනනය වන ඝණ අපද්‍රව්‍ය හා මුදා හරිනු ලබන ද්‍රව්‍ය පිරියම් කරනු ලබන හා සකස් කරනු ලබන ආකාරය පිළිබඳ සැළසුම ඔහුගේ අයදුම්පත්‍රයේ ඇතුළත් කළ යුත්තේ ය.

නිවාස පරිශ්‍රයන්

08. (i) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයකින් එකතු කරනු ලැබූ අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය
(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි
(ඉ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම එසේ තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම මලුවලට, බඳුන්වලට හෝ වෙනත් බහාලුම්වලට දැමිය යුතු අතර, ඒවා ඉවත් කරනු ලබන තෙක් ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයක තැබිය යුත්තේය. ආහාර අපද්‍රව්‍ය හා ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය තෙතමනය කාන්දු නොවන ද්‍රව්‍යයෙන් සාදනු ලැබූ සහ මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක තැබිය යුත්තේය. සතුන්ගේ මළකුණු ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය, බැහැරලිය යුතු අපද්‍රව්‍යවල ස්වාභාවය සැලකිල්ලට ගෙන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා කලින් කලට ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් අය කිරීමෙන් පසුව පමණක් ප්‍රාදේශීය සභාව විසින් අදාළ අපද්‍රව්‍ය භාර ගැනීම සිදු කළ යුතු ය.

(iii) සෑම හිමිකරුවෙකුටම හෝ පදිංචිකරුවෙකුටම 8 (i) උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. නොඑසේ නම් ප්‍රාදේශීය සභාව විසින් එම අපද්‍රව්‍ය එක්රැස් කරන බහාලුමකට බැහැරලීම කළ හැක්කේ ය.

09. (i) කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැගිල්ලක සෑම අයිතිකරුවෙක්ම ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන අයුරු තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය
(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි
(ඉ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) 9 (I) වන වගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු ඉහත (අ), (ආ) සහ (ඇ) යන අයිතමය යටතේ විස්තර කර ඇති අපද්‍රව්‍ය සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ ප්‍රමිතීන්ට පිරිවිතරයන්ට අනුකූල වූ බහාලුම් සපයාගත යුතු අතර ඒවා පවිත්‍රව හා සනීපාරක්ෂක තත්වයෙන් පවත්වාගත යුතු ය.

(iii) 9 (i) වන උප වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු (ii) වන උප වගන්තියේ විධිවිධානවලට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවකදී ලේකම්වරයා විසින් දැනුම්දෙනු ලබන දිනයකදී හෝ ඊට පෙර අදාළ බඳුන් හෝ බහාලුම් සපයන ලෙසට හිමිකරුට හෝ පදිංචිකරුට නියම කිරීමට ලේකම්වරයාට බලය ඇත්තේය. ලේකම්වරයාගේ නියමයන් අනුව ක්‍රියා කිරීම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේ ය.

(iv) ගොඩනැගිල්ලේ බිමක හෝ මහලක හිමිකරු හෝ පදිංචිකරු තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාළ බඳුනකට හෝ බහාලුමකට දැමිය යුත්තේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 9(i) වන උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම බලයලත් එක්රැස් කරන්නෙකුගේ කාර්යය වන්නේ ය. එසේ ඉවත් කරනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් ප්‍රාදේශීය සභාව විසින් ඒ සඳහා විශේෂයෙන් සකස් කර පවත්වාගෙන යනු ලබන ස්ථානයකට බැහැර කිරීම හෝ එසේ ප්‍රාදේශීය සභාව වෙනුවෙන් කසල එක්රැස් කරන්නෙකුට භාර දීම කළ යුත්තේ ය.

(vi) ඉහත 9 (i) (ඇ) අයිතමයෙහි සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත (අ), (ආ), (ඇ) සහ (ඉ) යන අයිතමයන් යටතේ මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර නිවාස පරිශ්‍රයේ අයිතිකරු, කුලී නිවැසියා හෝ පදිංචිකරු එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය ලබා දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතුය.

10. (i) ප්‍රාදේශීය සභාවේ පූර්ව අනුමැතිය ලබාගෙන මුඩුක්කු නිවැසියන්ගේ භාවිතය සඳහා ලේකම්වරයා විසින් අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නොමිලයේ සැපයීම නීත්‍යානුකූල වේ.

(ii) සෑම මුඩුක්කු නිවසකම හිමිකරු හෝ පදිංචිකරු ඔහුගේ වාසස්ථානයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කර ඔහුගේ වාසස්ථානයට ආසන්නවම සපයනු ලබන අනුමත බඳුන්වලට හෝ බහාලුම්වලට දැමිය යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය

(iii) මේ අතුරු ව්‍යවස්ථාවේ 10 (ii) වන උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම පිණිස අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට අවසර දීම ලේකම්වරයාගේ කාර්යය විය යුත්තේ ය.

සාප්පු සහ කාර්යාල

11. (i) සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ කළමණාකරුවෙක්ම එක් එක් සංකීර්ණයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය
(ඈ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේ ය.

(iii) සාප්පුවක හෝ කාර්යාලයක හිමිකරුට හෝ කළමණාකරුට මෙම අතුරු ව්‍යවස්ථාවේ 11 (i) වන උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) මහල් කිහිපයකින් යුක්ත සාප්පු හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හෝ කළමණාකරු ලේකම්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම සාප්පුවෙන් හෝ කාර්යාලයෙන් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 11 (iv) වන උප වගන්තියේ විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති සාප්පුවක හෝ කාර්යාලයක යම් හිමිකරුවෙක් තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම බඳුන්වලට හෝ බහාලුම්වලට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ 11 (i) වන උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට සෑම හිමකරුවෙකුට සහ කළමණාකරුවෙකුට අයිතිවාසිකමක් ඇත.

(vi) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් නොකරන ලද මෙම අතුරු ව්‍යවස්ථාවේ 11 (i) වන උප වගන්තියේ (ඇ) අයිතමයේ සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් අය කිරීමෙන් පසු ප්‍රාදේශීය සභාවේ කසල එක්රැස් කරන්නෙකු වෙත භාරදීම නීත්‍යානුකූල වන්නේ ය.

(vii) ඉහත (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත (අ), (ආ), (ඇ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමග මිශ්‍රවීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙකුම හෝ කළමණාකරුවෙකුම එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

(viii) අසල්වාසීන්ට හෝ එකී සාප්පුවේ හෝ කාර්යාලයේ සේවයේ නියුතු තැනැත්තන්ට හෝ යම් සෞඛ්‍ය හෝ සනීපාරක්ෂක ගැටළුවක් ඇති නොවීම පිණිස අපද්‍රව්‍ය ඉවත් කිරීමත් මෙම අතුරු ව්‍යවස්ථාවේ විශේෂයෙන් නියම කර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නඩත්තු කිරීමත් යම් සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙකුගේම හෝ කළමණාකරුවෙක්ගේම වගකීම වන්නේ ය.

හෝටල්

12. (i) සෑම හෝටල්කරුවෙක්ම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තම පරිශ්‍රයේ එක්රැස් වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය. නැතහොත් එසේ කිරීමට සැලැස්විය යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රිකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය
(ඈ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) සෑම හෝටල්කරුවෙක්ම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තෙක් වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iii) සෑම හෝටල්කරුවෙක්ම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතෙකු ඇතුළු වීම වළකමින් සියළුම ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද සහ පියනක් යොද නිසි ලෙස ආරක්ෂාකාරී කරන ලද බඳුනක හෝ වෙනත් බහාලුමක ඇසිරිය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 12(i) වන උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 12 (iv) වන උප වගන්තිය යටතේ බාර ගනු නොලැබූ ඉහත (අ), (ආ) අයිතම යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් එවැනි කසල එක්රැස් කිරීම සඳහා විශේෂිතව සකස් කරන ලද බහාලුමකට හෝ නම් කරන ලද ස්ථානයට බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(vi) ඉහත (ඇ) ඡේදයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත (අ), (ආ), (ඇ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමග මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර සෑම හෝටල් හිමකරුවෙකුම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

එළවළු සහ පළතුරු වෙළඳසැල්

13. (i) සෑම එළවළු සහ පළතුරු වෙළඳසැලකම හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා තම වෙළඳසැලේ එක්රැස්වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) මිනිස් පරිභෝජනයට නුසුදුසු එළවළු, පළතුරු හෝ වෙනත් යම් දිරන අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 13 (i) වන උප වගන්තියේ (අ) අයිතමයෙහි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යකින් සාදන ලද වෙනම බහාලුමක තැබිය යුතු අතර එය තුළට මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේ ය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු යම් බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 13(i) වන උප වගන්තියේ (අ), (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතුය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 13 (iii) වන උප වගන්තිය යටතේ භාර ගනු නොලැබූ ඉහත (අ), (ආ) ඡේද යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍යය සභාව විසින් එවැනි කසළ එක්රැස් කිරීම සඳහා විශේෂිතව පත් කරන ලද බහාලුමකට හෝ ස්ථානයකට බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

මස්, මාළු, හෝ බිත්තර වෙළඳ කුටි

14. (i) තත් කාර්යය සඳහා සභාපතිවරයා විසින් ඊට අදාළ යම් ලිඛිත නීතියක් යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ප්‍රකාර එහි සඳහන් ස්ථානයේදී කිසිම තැනැත්තෙක් ගෝඝාතක ආඥා පනතේ විධිවිධාන යටතේ අවසරලත් සතුන් හැරුනුවිට වෙනත් කිසිම සතෙකු ඝාතනය නොකළ යුත්තේ ය.

(ii) මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යාපාරය කරගෙන යන අය හෝ ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) මිනිස් පරිභෝජනයට නුසුදුසු සත්ව මළකුණු හෝ මළකුණුවල කොටස් හෝ වෙනත් දිරන අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රිකරණීය අපද්‍රව්‍ය

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම භාජනයක හෝ වෙනත් බහාලුමක් තුළට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ 14 (ii) වන උප වගන්තියේ (අ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන බහාලුමක් ඇතුලත තැබිය යුතු අතර එම බහාලුමට මැස්සන්, මීයන්, කෘමීන් හෝ වෙනත් සතුන් ඇතුලුවීම වළකමින් එය නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 14 (ii) වන වගන්තියේ (අ), (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග අවසර ලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දිය යුතුය. එසේ භාරදෙනු නොලැබූ ඉහත (අ), (ආ) අයිතම යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍යයක් ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යන කසල එක්රැස් කරන තැනැත්තෙකුට භාරදීම හෝ ස්ථානයකට බැහැර කිරීම කළ යුත්තේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 14 (iv) වන උප වගන්තිය යටතේ භාර ගනු නොලැබූ ඉහත (අ), (ආ) අයිතම යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් එවැනි කසල එක්රැස් කිරීම සඳහා විශේෂිතව පත් කරන ලද බහාලුමකට හෝ ස්ථානයකට බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

පදික වෙළඳාම හෝ සංචාරක වෙළඳාම

15. (i) අපද්‍රව්‍ය ජනනය වන්නාවූ ව්‍යාපාරයක් පවත්වාගෙන යන සංචාරක හෝ පදික වෙළෙන්දෙක්, ඊට අදාලව යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ විධිවිධාන සලසා ඇති පරිදි හා ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක් තබාගත යුත්තේ ය. එවැනි කිසිම අපද්‍රව්‍යයක් පදික වේදිකාවේ, මහා මාර්ගයේ ජල කානුවකට හෝ පොදු ස්ථානයකට නොදැමිය යුත්තේ ය.

(ii) සෑම පදික හෝ සංචාරක වෙළෙන්දෙක්ම වාහනවල ගමනාගමනයට හෝ පදිකයින්ගේ ගමනාගමනයට බාධා ඇති වන ආකාරයෙන් බඳුනක් හෝ වෙනත් බහාලුමක් නොතැබිය යුත්තේ ය.

(iii) සෑම පදික හෝ සංචාරක වෙළෙන්දෙක්ම ඔහුගේ ව්‍යාපාරය හේතුවෙන් ජනනය වන්නාවූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය සහ වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය

(iv) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම බඳුනක් හෝ වෙනත් බහාලුමක් තුළට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ 15 (iii) උප වගන්තියේ (අ) අයිතමයේ සඳහන් කර ඇත්තා වූ අපද්‍රව්‍ය කෘමීන්, මීයන් හෝ වෙනත් සතුන් විසින් කා දැමීමට නොහැකි වන පරිදි ආරක්ෂාකාරී බහාලුමක අභ්‍යන්තරයේ තැබිය යුතු අතර අමතර අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය වන විට හැර එය වසා තැබිය යුත්තේ ය.

(v) සෑම පදික වෙළෙන්දෙක්ම හෝ සංචාරක වෙළෙන්දෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ 15 (iii) උප වගන්තියේ (අ) හා (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍යය එක්රැස් කරන්නෙකුට භාර දිය යුතුය.

(vi) ඉහත (iii) (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍යය ඉහත (අ), (ආ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමග මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර පදික වෙළෙන්ද හෝ සංචාරක වෙළෙන්ද එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය ලබා දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතුය.

(vii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (v) වන උප වගන්තිය යටතේ භාරගනු නොලැබූ ඉහත (අ), (ආ) අයිතම යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් එවැනි කසල එක්රැස් කිරීම සඳහා විශේෂිතව තබන ලද බහාලුමකට හෝ ස්ථානයකට බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය. සෑම සංචාරක/පදික වෙළෙන්දෙක්ම අපද්‍රව්‍ය බඳුන් නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දීමට පෙර ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවිය යුත්තේ ය.

කර්මාන්ත ශාලා

16. (i) සෑම කර්මාන්ත ශාලා හිමිකරුවෙක්ම හෝ නිෂ්පාදකයෙක්ම කර්මාන්ත ශාලා පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කර පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය
(ඈ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 16 (1) යන උප වගන්තියේ (අ), (ආ) හා (ඇ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ගාස්තුවක් ප්‍රාදේශීය සභාව වෙත ගෙවීම මත ප්‍රාදේශීය සභාවේ කසල එක්රැස් කරන්නෙකුට භාර දීම කළ යුතු ය.

(iii) වයඹ පළාතේ 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉවත් කළ යුතු වන්නේ ය.

(iv) ඉහත 16 (i) (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍යය ඉහත (අ), (ආ) (ඈ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමග මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර කර්මාන්ත ශාලා හිමිකරු හෝ ඔහු විසින් බලය දී ඇති තැනැත්තා එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය ලබා දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

කැනීම්, ඉදිකිරීම් සහ කඩා දැමීම

17. (i) යම් වීථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින හෝ යම් නිර්මාණයක් ඉදිකරන හෝ කඩාදමන සෑම තැනැත්තෙක්ම එමගින් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය සුදුසු ආකාරයකින් එකී පරිශ්‍රයෙන් ඉවත් කරන තෙක් පරිශ්‍රය ඇතුළත හෝ ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ස්ථානයක හෝ ගබඩා කළ යුත්තේ ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 17 (i) වන උප වගන්තියේ සඳහන් වන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

ආරෝග්‍යශාලා

18. (i) ආරෝග්‍යශාලාවක භාරකරු පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) සායනික අපද්‍රව්‍ය
(ඈ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය
(ඉ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) 18 (i) වන උප වගන්ති යටතේ (අ) සහ (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුතු අතර, එකී අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් ඒ සඳහා විශේෂයෙන් සලසා ඇති වැඩපිළිවෙලක් යටතේ කසල එක්රැස් කරනු ලබන අවස්ථාවක ප්‍රාදේශීය සභාව වෙනුවෙන් එසේ කසල එක්රැස් කරන්නා වෙත භාර දිය යුතුය. 18 (i) උප වගන්තියේ (ඉ) අයිතමය යටතේ සඳහන් කර ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසු එක්රැස් කරන්නා වෙත භාර දිය යුතුය.

(iii) 18 (i) (ඇ), (ඈ) අයිතම යටතේ එකතුවන අපද්‍රව්‍ය කවර ආකාරයකින් හෝ වෙනත් අපද්‍රව්‍ය සමග මිශ්‍ර නොකළ යුතු අතර එකී අපද්‍රව්‍ය වයඹ පළාතේ 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව බැහැර කළ යුත්තේ ය.

පෞද්ගලික රෝහල් හා රසායනාගාර

19. (i) පෞද්ගලික රෝහලක හෝ රසායනාගාරයක හිමිකරු හෝ අයිතිකරු තම ආයතනය තුළ ජනනය වන්නාවූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රිකරණීය අපද්‍රව්‍ය
(ඇ) සායනික අපද්‍රව්‍ය
(ඈ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය
(ඉ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) 19 (i) වන උප වගන්තිය යටතේ (අ) සහ (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුතු අතර එකී අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් ඒ සඳහා විශේෂයෙන් සලසා ඇති වැඩ පිළිවෙළක් යටතේ කසල එක්රැස් කරන අවස්ථාවක ප්‍රාදේශීය සභාව වෙනුවෙන් එසේ කසල එක්රැස් කරන්නා වෙත භාර දිය යුතු ය.

(iii) 19 (i) උප වගන්තියේ (ඉ) අයිතමය යටතේ සඳහන් කර ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කළ තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසු එක්රැස් කරන්නා වෙත භාරදිය යුතුය.

(iv) ඉහත 19 (i) උප වගන්තියේ (ඇ), (ඈ) අයිතමය යටතේ එකතු වන අපද්‍රව්‍ය කවර ආකාරයකින් හෝ වෙනත් අපද්‍රව්‍ය සමග මිශ්‍ර නොකළ යුතු අතර එකී අපද්‍රව්‍ය 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්ති යටතේ නිකුත් කරනු ලැබූ පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව බැහැර කළ යුත්තේ ය.

වෙනත් පරිශ්‍රයන්

20. (i) අංක 8 සිට 19 දක්වා වන ඡේදයන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙක් හෝ මහජනතාවගේ සහභාගිත්වය ඇතිව පොදු, ආගමික, සාමාජීය, සංස්කෘතික හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධානය කරන හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක් එකී ක්‍රියාකාරකම නිසා හෝ එවැනි ආයතනයක් පවත්වාගෙන යාම නිසා ජනනය වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය
(ඈ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) 20 (i) වන උපවන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන පුද්ගලයෙක් එම ක්‍රියාකාරකම නිසා ජනනය වන්නාවූ අපද්‍රව්‍ය එක්රැස් කිරීමට විශේෂ වැඩපිළිවෙලක් යෙදීමට හැකිවනු පිණිස ඒ ගැන කල්තියා ප්‍රාදේශීය සභාවට දැනුම්දිය යුත්තේ ය.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරගනු ලබන තෙක් වෙනම බහාලුම්වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 20 (i) වන උපවගන්තියේ (අ), (ආ) හා (ඇ) අයිතම යටතේ එක්රැස් වන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබූ පරිදි ප්‍රකාශයට පත් කර ඇති ගාස්තුවක් අය කර ප්‍රාදේශීය සභාව විසින් බලය දී ඇති කසල එක්රැස් කරන්නෙකු විසින් භාර ගැනීම නිත්‍යානුකූල වන්නේ ය.

(v) එසේ වුවද කිසියම් වූ ආගමික ස්ථානයක ආගමික කාර්යයක් වශයෙන් වානිජ පරමාර්ථයකින් තොරව පවත්වාගෙන යන කවර ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් වුවද එකී ක්‍රියාකාරකම හේතුවෙන් එක්රැස් වන ඉහත (i) උප වගන්තියේ (අ), (ආ) සහ (ඇ) යන අයිතම යටතේ එක්රැස්වන අපද්‍රව්‍ය බැහැර කරලීම සම්බන්ධයෙන් ඉහත (iv) උප වගන්තියේ සඳහන් සභාව විසින් කලින් කළ තීරණය කරනු ලබන ගාස්තුවක් අය කිරීම යන්න අදාළ නොවේ.

(vi) ඉහත (i) (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍යය ඉහත (අ). (ආ) සහ (ඇ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමග මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර අදාළ පරිශ්‍රවල හිමිකරුවන් එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය ලබා දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

වීථි සහ පොදු ස්ථාන

21. (i) ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන ආකාරයට සභාපතිවරයා විසින් පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුත්තේ ය.

(අ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි වීථි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළඳ පොළවල් පිරිසිදු හා සනීපාරක්ෂක තත්වයෙන් පවත්වා ගැනීම.

(ආ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කසල තාවකාලිකව එක්රැස් කිරීමට යථායෝග්‍යයැයි හඳුනාගන්නා ස්ථානයන්හි ප්‍රමාණවත් බක්කි සංඛ්‍යාවක් සවි කිරීම හා නඩත්තු කිරීම.

(ඇ) උත්සවවලදී, විශේෂ සිදුවීම් අවස්ථාවලදී හෝ ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන සිදුවීම් අවස්ථාවල දී ප්‍රාදේශීය සභාවෙන් තීරණයක් කරන විටකදී හෝ එකී උත්සව හෝ විශේෂ සිදුවීම් අවස්ථා සංවිධායකවරුන්ගේ ඉල්ලීමක් මත හෝ පොදු ස්ථානයන්හි භාවිතය සඳහා ජංගම අපද්‍රව්‍ය බක්කි සැපයීම.

(ඈ) කසල තාවකාලික එක්රැස් කිරීමට යථායෝග්‍ය යැයි හඳුනාගෙන ඇති ස්ථානවල සවි කර ඇති පොදු අපද්‍රව්‍ය බක්කි හෝ බහාලුම් සනීපාරක්ෂක තත්වයෙන් පවත්වා ගැනීම සහ ඒ ආසන්නයේ පදිංචි වැසියන්ට එය පීඩාවක් වීමට පෙර එම බක්කිවල හා බහාලුම්වල තැන්පත් කර ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම.

(ඉ) පූර්වගාමී වගන්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශන කිරීම හා අප්‍රමාදව ඒ ගැන ක්‍රියා කිරීම.

(ii) ප්‍රාදේශීය සභාව විසින් විශේෂයෙන්ම එක් එක් අපද්‍රව්‍ය සඳහා වෙන් කරනු ලැබූ බක්කියක ඊට අදළ නොවන අපද්‍රව්‍ය තැන්පත් කිරීම කිසිම තැනැත්තෙක් නොකළ යුත්තේ ය.

ප්‍රාදේශීය සභාවේ යුතුකම්

22. (i) ලේකම්වරයා විසින් සභාපතිවරයා සමග සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ හැක්කේ ය.

(අ) අපද්‍රව්‍ය අඩු කිරීමට, ප්‍රතිභාවිතයට හා ප්‍රතිචක්‍රීකරණයට ජනතාව ධෛර්යමත් කිරීම.

(ආ) අපද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, එක්රැස් කිරීම, ගබඩා කිරීම, මුදහැරීම හා බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මඟින් ප්‍රචාරණය කිරීම.

(ඇ) ප්‍රතිභාවිතකරණ හා ප්‍රතිචක්‍රීකරණ කටයුතුවල නියුක්ත පුද්ගලයින්ට හා කුඩා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම.

(ඈ) අපද්‍රව්‍ය අඩු කිරීමේ, ප්‍රතිභාවිතා කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වී සිටින අයට දිරි ගැන්වීම් පිරිනැමීම.

(ඉ) අපද්‍රව්‍ය මුදාහැරීමේ ක්‍රම පිළිබඳ ආකෘති නියාමනය කිරීම.

(ඊ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක් එක් ප්‍රදේශයන්හි එක් එක් අපද්‍රව්‍ය වර්ග සඳහා ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්කාසු කරන දිනයන්, වේලාවන්, ක්‍රමවේදයන් හා ගාස්තු සඳහන් කරමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ කාල සටහනක් පිළියෙළ කිරීම සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන් හි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා වන කොන්දේසි එම කාල සටහනේ ඇතුළත් කිරීම.

(උ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට වෙනම භාරදෙනු නොලැබූ යම් වෙන් කරන ලද අපද්‍රව්‍යයක් කාල සටහනට අනුව නියමිත වේලාවට එක්රැස් කිරීම.

(ඌ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදෙනු නොලැබූ අන්තරායකාරී අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහනය කිරීම.

(එ) අන්තරායකාරී අපද්‍රව්‍ය හෝ ලේකම්වරයා විසින් නියම කරන ලද වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර විථි අතුගැමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය පොදු බක්කිවලින් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය සහ ප්‍රාදේශීය සභාවේ කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දීම හෝ ප්‍රාදේශීය සභාව විසින් විධිමත් පරිදි බැහැර කිරීමට කටයුතු කිරීම.

(ඒ) ආහාර සහ වෙනත් ජෛව ජීරණනීය ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය ප්‍රායෝගිකව කළ හැකි තාක් මුළුමනින්ම හෝ කොටසක් හෝ සැකසීමට හා පිරියම් කිරීමට වැඩ පිළිවෙලක්ද ඇතුළත්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නන් විසින් එක්රැස් කරනු ලබන වෙන් කරන ලද අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ එම ක්‍රියාවලියෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ගවල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය ලේකම්වරයා අනුමත කරන ආකාරයට බැහැරලීමට යෝග්‍ය පියවර ගැනීම.

(ඔ) වයඹ පළාත් පරිසර අධිකාරිය සමග අන්තරායකාරී අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් සියළු කටයුතු නියාමනය කිරීම.

(ඕ) 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියේ විධිවිධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීම සහ එම බල පත්‍රයේ හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති කොන්දේසිවලට යටත්ව අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂක බිම් පිරවුමක් පවත්වාගෙන යාම හෝ විධිමත් විකල්ප ක්‍රමවේදයක් පවත්වාගෙන යාම.

(ක) අපද්‍රව්‍ය අතුගැම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම හා බැහැරලීම යන කාර්යයන් හි නිරතවන සෑම සේවකයෙකුටම පිරිසිදුකාරක ද්‍රව්‍ය, සුදුසු ඇඳුම්, අත් ආවරණ, මුඛ ආවරණ සහ බූට් සපත්තු සැපයීම හා එකී සේවකයින් සඳහා සුදුසු රක්ෂණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම හා වසරකට දෙවරකට නොවැඩි සෞඛ්‍ය සායනයන් පැවැත්වීම.

(ග) ප්‍රාදේශීය සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.

(ජ) 2000 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ පිළිබඳ ජාතික උපාය මාර්ගය සහ අදාළ නීතියට හා 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියට අනුකූලව සවිස්තර වශයෙන් යටත් පිරිසෙයින් එක් ලිත් වර්ෂයක් ආවරණය කරන හා අවසාන බැහැරලීම සම්බන්ධයෙන් වර්ෂ 03 ක් ඉදිරියට ආවරණය කරන ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම හා එම සැලැස්ම එය ආවරනය කරන කාලසීමාව අනුව නිරන්තර පදනම මත ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂිකව අනුමත කරනු ලැබීම.

(ට) (අ) සිට (ජ) දක්වා අයිතමයන්හි සඳහන් වන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලැබෙන යම් පැමිණිල්ලක් එය අදාළ වන්නේ උද්ගත විය හැකි පීඩාවකට නම් දින තුනක් ඇතුලතත් වෙනත් පැමිණිල්ලක් නම් දින දහතරක් ඇතුළතත් විමර්ශණය කිරීම හා වහාම අවශ්‍ය කටයුතු කිරීම.

අවසර පත්‍රය

23. (i) අපද්‍රව්‍ය ප්‍රතිභාවිතයට ගන්නා වූ හා ප්‍රතිචක්‍රීකරණය කරන්නා වූ හෝ කොම්පෝස්ට්, ජීව වායු හෝ වෙනත් නිපැයුම් නිර්මාණය කරන්නා වූ යම් තැනැත්තෙක් හෝ තැනැත්තන් පහත දක්වෙන කරුණු සපුරාලන්නේ නම් ඔහුට ප්‍රාදේශීය සභාව විසින් අවසරපත්‍රයක් නිකුත් කරනු ඇත.

(අ) ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත හෝ වෙනත් පළාත් පාලන ආයතන ප්‍රදේශයක හෝ යම් ව්‍යාපාරයක් කරගෙන යාම.

(ආ) 1990 අංක 12 දරන වයඹ පළාත් පරිසර ප්‍රඥප්තිය යටතේ විධිවිධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම.

(ඇ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන තිබීම.

(ඈ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන පරිදි හා ජනතාවට පීඩාවක් සිදු නොවන සනීපාරක්ෂක ක්‍රමයකට ප්‍රවාහනය කිරීම සඳහා වාහන තිබීම.

(ඉ) අදාළ ව්‍යාපාරය ප්‍රාදේශීය සභාවේ සීමාවක් ඇතුළත කරගෙන යනු ලබන විටෙක දී ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා ගාස්තුවක් සභාවට ගෙවීම මත අපද්‍රව්‍ය සැකසීමේදී හෝ පිරියම් කිරීමේදී අවශේෂ වන්නාවූ හෝ ප්‍රතික්ෂේප වන්නා වූ හෝ අතුරු නිෂ්පාදන වශයෙන් නිර්මාණය කෙරෙන්නාවූ අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරනු ලබන පරිදි ප්‍රාදේශීය සභාවට භාර දීමට එකඟ වීම.

(ii) ප්‍රාදේශීය සභාව අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂ්ප කළ විටෙක හෝ නිෂ්ප්‍රභා කළ විටෙක ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත් එසේ ප්‍රතික්ෂේප කිරීමට හා නිෂ්ප්‍රභා කිරීමට හේතු අවසර පත්‍රය සඳහා ඉල්ලුම් පත්‍රය ලැබී දින 30 ක් ඇතුළත ලිඛිතව ඉල්ලුම්කරුට දැනුම් දිය යුත්තේ ය.

(iii) ලේකම්වරයා විසින්, වලංගු කාල පරිච්ඡේදය තුළ එක් රැස් කිරීමට අවසර දෙනු ලබන අපද්‍රව්‍ය වර්ගය හෝ වර්ග එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසර දෙනු ලබන ප්‍රදේශය සහ වෙනත් සුදුසු කොන්දේසි අවසර පත්‍රයේ දැක්විය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 23 (i) වන උප වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා නොකරන අවස්ථාවකදී මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය අවලංගු කළ යුත්තේ ය.

(v) 23 (iv) වන උප වගන්තියේ විධිවිධාන යටතේ අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවකදී කිසියම් තැනැත්තෙක් අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ ලබාගැනීම හෝ නොකළ යුත්තේ ය. එවැනි අවස්ථාවකදී අවසර පත්‍රය අවලංගු කරනු ලැබූ බවට ජනතාව දැනුවත් කිරීම පිණිස ලේකම්වරයා මාධ්‍ය මගින් හෝ වෙනත් ක්‍රමයකින් ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදිය යුත්තේ ය.

අපද්‍රව්‍ය බැහැරලන ප්‍රදේශ

24. ප්‍රාදේශීය සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීමේ කාර්යයන් සඳහා වෙන් කරන ලද ප්‍රදේශ වලට අවසර නොලත් තැනැත්තෙක් ඇතුළු නොවිය යුතු හා එහි නොගැවසිය යුතු අතර, එම ප්‍රදේශයේ යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඉවතලන දෙයක් තැන්පත් කිරීම, අවුල් කිරීම, හෝ ඉවත් කිරීම නොකළ යුත්තේ ය. කිසිම තැනැත්තෙක් විශේෂයෙන් නියම කරනු ලබන කොන්දේසි වලට යටත්ව ප්‍රාදේශීය සභාව විසින් අවසර දෙනු ලැබූවහොත් මිස ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි යම් තහනම් කරන ලද අපද්‍රව්‍ය තැන්පත් කිරීම නොකළ යුත්තේ ය.

25. අනුමත කිරීමේ යම් කොන්දේසිවලට යටත්ව ලේකම්වරයාගේ සහ වයඹ පළාත් පරිසර අධිකාරීයේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව මිස කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ පහසුකමක් එයට පිටස්තර ස්ථානයක ජනනය වන්නාවූ අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා සැපයීම හෝ භාවිතා කිරීම නොකළ යුත්තේ ය.

26. අපද්‍රව්‍ය බැහැර කරනු ලබන කවර ස්ථානයන් වුවද එකී ස්ථානයට නැතහොත් ඉඩමට මායිම් වන සීමාව තාප්පයක් හෝ ඒ සඳහා සුදුසු ආවරණයක් මගින් සීමා කර තිබිය යුතු අතර එකී ස්ථානයට හෝ ඉඩමට බැහැර ලන කැලිකසල සුළඟ, ජලය වැනි කාරණා හේතු කොටගෙන යාබඳ ඉඩම් හෝ ප්‍රදේශ වෙත යොමු වීමට නොහැකි වන ආකාරයට පවත්වාගෙන යායුතු ය.

වෙනත්

27. (i) සභාපතිවරයා හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට සියළු සාධාරණ වේලාවන්හීදී යම් පරිශ්‍රයකට ඇතුළත් වීමට සහ එහි හිමිකරු හෝ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන්නේ දැයි පරීක්ෂා කර බැලීමට බලය ඇත්තේ ය.

(ii) එම පරිශ්‍රයේ හිමිකරු, පදිංචිකරු, භාරකරු, කළමණාකරු හෝ එහි වාසය කරන්නාවූ හෝ සේවය කරන්නාවූ යම් තැනැත්තෙක් සභාපතිවරයාට හෝ ඔහුගේ යම් බලයලත් නිලධාරියෙකුට අවශ්‍ය කරන තොරතුරු ඉදිරිපත් කළ යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ සභාපතිවරයාගේ ඔහුගේ බලයලත් නිලධාරියෙකුට සිය බලතල භාවිතා කිරීමෙහිලා කිසිම තැනැත්තෙක් බාධා නොකළ යුත්තේ ය.

දණ්ඩන

28. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කවර හෝ වගන්තියක් උල්ලංඝනය කිරීම වරදකරු වන අතර එම වරද සම්බන්ධයෙන් බලය ලත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය යටතේ සඳහන් දණ්ඩන සීමාවන් යටතේ දඬුවම් ලැබිය යුතු යි.

අර්ථ නිරූපණය

29. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

"අපද්‍රව්‍ය හෝ ඝන අපද්‍රව්‍ය" යන්නෙන් ඒවා ඉවත දමූ තැනැත්තාට පරිභෝජන වටිනාකමක් නොමැති ද්‍රව්‍ය අදහස් වන අතර රොඩු, කසළ, විටී ශුද්ධ කිරීමේ එකතුවන අපද්‍රව්‍ය, දූවිලි, පස්, මඩ සහ අළු ද අදහස් කෙරේ.

"ආහාර අපද්‍රව්‍ය" යන්නෙන් මිනිස් පරිභෝජනය සඳහා පාවිච්චියට ගත නොහැකි ආහාර ද්‍රව්‍ය අදහස් කෙරේ.

"උපද්‍රවකාරී අපද්‍රව්‍ය" යන්නෙන් මහජන සෞඛ්‍යයට හෝ පරිසරයට හානි දයක වන විෂ සහිත, දැවෙන සුළු, ප්‍රතික්‍රියා දක්වන සුළු, රෝග කාරක, විකිරණශීලී ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

"එක් රැස් කිරීම" යන්නෙන් බලයලත් එක්රැස් කරන්නෙකු හෝ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් ප්‍රතිචක්‍රීකරණය, සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීමේ පහසුකම් සඳහා ප්‍රවාහනය කිරීම පිණිස අපද්‍රව්‍ය එකතු කිරීම අදහස් කෙරේ.

"කොම්පෝස්ට්" යන්නෙන් කාබනික අපද්‍රව්‍ය ක්ෂුද්‍රජීවි ජීර්ණයට ලක්වීමෙන් පසුව ලැබෙන අවසන් නිමැවුම අදහස් කෙරේ. එය පාංශු තත්වාරක්ෂකයක් ලෙස ක්‍රියාකල හැකි හියුමස් ද්‍රව්‍යයකි.

සභාපතිවරයා :- ප්‍රාදේශීය සභාව සඳහා තේරීපත්වී ඇති සභාපතිවරයා

"ලේකම්" යන්නෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සම්බන්ධයෙන් වන විට ප්‍රාදේශීය සභා පනත යටතේ එම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා අදහස් කෙරෙන අතර එම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වෙනුවෙන් වැඩ බැලීමට පත් කරන ලද යම් තැනැත්තෙකු සහ ප්‍රාදේශීය සභා පනත යටතේ ලේකම්වරයාගේ බලතල යුතුකම් හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට බලය දෙනු ලැබූ එකී සභාවේ යම් නිලධාරියෙකු එම නිලධාරියාට එම බලය දෙනු ලැබ ඇති ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"ගබඩා කිරීම" යන්නෙන් හිමිකරුවකුගේ හෝ පදිංචිකරුවකුගේ පරිශ්‍රය ඇතුළත හෝ අනුමත පොදු එක්රැස් කිරීමේ ස්ථානයක අපද්‍රව්‍ය තැබීම හෝ තැන්පත් කිරීම අදහස් කෙරේ.

"ගාස්තුව" යන්නෙන් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන කිසියම් ගාස්තුවක් අදහස් කෙරේ.

"ගෙවතු අපද්‍රව්‍ය" යන්නෙන් ගෙවත්තක පිහිටි ගස්වලින් හෝ පැළවලින් ඉවත් කෙරෙන ශාඛා කොටස් සහ ගෙවත්තකින් ඉවත් කරනු ලබන ගල්, පස් ආදිය අදහස් කෙරේ.

"ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය" යන්නෙන් ක්ෂුද්‍ර ජීවි කාරකයන් මගින් දිරාපත් කරනු ලැබිය හැකි. අපද්‍රව්‍ය අදහස් කෙරේ.

"පොදු ස්ථානය" යන්නෙන් පාරක්, පිට්ටනියක්, පොදු ඉඩමක්, මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිටියක්, පොදුගොඩනැගිල්ලක්, සුසානභූමියක්, බස්නැවතුම්පළක්, දුම්රිය ස්ථානයක්, ගඟක්, ඇළක්, දෙළක්, විලක්, ජලාශයක්, පොකුණක්, තටාකයක්, කලපුවක්, අතු ගඟක්, ජල මාර්ගයක්, මුහුදු, මුහුදු වෙරළ හෝ මහජනතාව විසින් පොදුවේ පාවිච්චි කරනු ලබන වෙනත් ස්ථානයක් අදහස් කෙරේ.

"ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය" යන්නෙන් අපද්‍රව්‍ය තවදුරටත් අපද්‍රව්‍ය වශයෙන් හඳුනාගත නොහැකි වන පරිදි එහි ස්වරූපය වෙනස් කරමින් නව පාරිභෝජනය නිෂ්පාදනයන් කිරීමට යොදගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය'' යන්නෙන් සේදීමෙන්, විෂබීජ නැසීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් පිරිසිදු කිරීමෙන් පසුව උපයෝගීකර ගත හැකි අප ද්‍රව්‍ය අදහස් කෙරේ.

''ප්‍රවාහනය'' යන්නෙන් මිනිස් සත්ව හෝ යාන්ත්‍රික බලයකින් ක්‍රියා කරන යම් ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයක් යොදා ගනිමින් අපද්‍රව්‍ය එක්රැස් කරනු ලබන ස්ථානයේ සිට ඒවා සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම සඳහා ඇති ස්ථානය වෙත ගෙන යාම අදහස් කෙරේ.

''බක්කිය/බඳුන් හෝ වෙනත් බහාලුම්'' යන්නෙන් අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව අපද්‍රව්‍ය ගබඩා කිරීම, මුද්‍රාහැරීම, එක්රැස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් ආවරණයක් සහිත වූ බක්කියක්, බඳුනක් හෝ උරයක්, මල්ලක් හෝ වෙනත් බහාලුමක් අදහස් කෙරේ.

''බලයලත් එක් රැස් කරන්නා'' යන්නෙන් අපද්‍රව්‍ය එක්රැස් කිරීමට හෝ ලබාගැනීමට ලේකම්වරයාගෙන් අවසර පත්‍රයක් ලබා ගන්නා තැනැත්තෙකු අදහස් කෙරේ.

''බලයලත් නිලධාරී'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වන රාජකාරි ඉටු කිරීමට හෝ කරගෙන යාමට අවස්ථාවෝචිතව ලේකම්වරයා හෝ සභාපතිවරයා විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකු අදහස් කෙරේ.

''බැහැරලීම'' යන්නෙන් ප්‍රතිභාවිත නොකරන ලද්දවුත්, ප්‍රතිචක්‍රීකරණය නොකරන ලද්දවුත්, සැකසුම් නොකරන ලද්දවුත්, පිරියම් නොකරන ලද්දවුත් සියළුම අපද්‍රව්‍ය ස්ථිරවම රැඳවීමට අදහස් කරනු ලබන ඉඩමෙක මතුපිට හෝ ඇතුළත හෝ තැන්පත් කිරීම අදහස් කෙරේ.

''මාරු කරන ස්ථානය'' යන්නෙන් සභාව විසින් මේ කාර්යය සඳහා නියම කරනු ලබන ස්ථානයක් අදහස් කෙරෙන අතර ඒ ස්ථානයෙහි සිට යම් ප්‍රතිචක්‍රීකරණ, සැකසුම් කරන, පිරියම් කරන හෝ බැහැරලීම කරන පහසුකමක් වෙත අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා අපද්‍රව්‍ය වඩා කුඩා ප්‍රමාණයේ වාහනවලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහනවලට මාරුකිරීම එහිදී සිදු කෙරේ.

''තැනැත්තා'' යන්නෙන් සංස්ථාගත හෝ සංස්ථාගත නොවන සමාගමක් හෝ පුද්ගලයින්ගේ සමිතියක් හෝ මඩුල්ලක් හෝ යම් පුද්ගලයෙක්ද අදහස් කෙරේ.

''ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නා'' යන්නෙන් බක්කිවලින් හෝ බහාලුම්වලින් අපද්‍රව්‍ය අතුගා දැමීම, එක්රැස් කිරීම, ලබාගැනීම හෝ ඉවත් කිරීම සඳහා සභාව විසින් යොදවනු ලැබූ සේවකයෙකු හෝ මේ කාර්යයන් ඉටු කිරීමට සභාව සමග කොන්ත්‍රාත්තුවකට ඇතුළු වී සිටින තැනැත්තෙක් අදහස් කෙරේ.

''වෙන් කිරීම'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යොදා ඇති ප්‍රභේදයන්ට අනුකූලව අපද්‍රව්‍ය විවිධ වර්ගවලට තෝරා වෙන් කිරීම අදහස් කෙරේ.

''සැකසීම'' යන්නෙන් අපද්‍රව්‍ය ප්‍රයෝජනයට නිපැයුමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය අදහස් කෙරේ.

''සභාව'' යන්නෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාව අදහස් කෙරේ.

''ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය'' යන්නෙන් ප්‍රාදේශීය සභා පනත යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදේශය අදහස් කෙරේ.

''සනීපාරක්ෂක බිම් පිරවීම'' යන්නෙන් ඒ හා ආශ්‍රිත සාමාජයීය, සෞඛ්‍ය සහ පාරිසරික බලපෑම් අවම කිරීමට ශ්‍රී ලංකාවේ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව අපද්‍රව්‍ය භූමියකට අවසාන වශයෙන් බැහැර කරලීම අදහස් කෙරේ.

''හිමිකරු හෝ පදිංචිකරු'' යන්නෙන් පරිශ්‍රයේ හිමිකරු හෝ හිමිකරු වෙනුවෙන් ඇටෝර්නි බලය දරන යම් තැනැත්තෙකු හෝ හිමිකරු විසින් සිය කර්මාන්තය, කර්මාන්ත ශාලාව, වත්ත කළමණාකරණයට පත් කරන ලද නියෝජිතයෙකු හෝ භාරකරුවෙකු හෝ කුලියට ලබාගන්නා අයෙකු ඇතුළත් වන අතර වෙනත් තැනැත්තෙකුගේ නියෝග යටතේ ක්‍රියා කරන කළමනාකරුවෙකු ඇතුලත් වේ.

''මෙම වගන්තියේ කාර්යයන් සඳහා කැණීම, ඉදිකිරීම හා කඩාදැමීම යන ක්‍රියාවක නියුතු සෑම තැනැත්තෙකු'' යන්නට සේවා යෝජකයෙකු විසින් එම සේවය සඳහා නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තෙකුද ඇතුලත් වේ.

''ඉදිකිරීම් අපද්‍රව්‍ය'' යන්නට ඉදිකිරීමේදී ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතයෙන් ජනනය වන්නාවූ පස්, මඩ, දූවිලි, හා අපද්‍රව්‍ය සහ යම් ඉදිකිරීමක් කඩාදැමීමේ දී ජනනය වන්නාවූ අපද්‍රව්‍ය ඇතුලත් වේ.

''ආරෝග්‍ය ශාලාව'' යන්නෙන් අදහස් කරන්නේ යම් රෝගයකින් හෝ දුබලතාවයකින් පෙලෙන තැනැත්තන් හෝ සතුන් පිළිගැනීම, ඔවුන්ට සාත්තු කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොදගනු ලබන හෝ යොදගැනීමට අපේක්ෂා කරන යම් පරිශ්‍රයක් (කුමන ආකාරයෙන් විස්තර කරණු ලැබුවද) වන අතර සාත්තු නිවාසයක්, සායනයක්, වෛද්‍ය මධ්‍යස්ථානයක්, මාතෘ නිවාසයක් සහ සත්ව රෝහලක්/සත්ව සායන ඊට ඇතුළත් වේ.

''උපද්‍රවකාරී ආරක්ෂණ ද්‍රව්‍ය'' යන්නෙන් අදහස් කරන්නේ සායනික අපද්‍රව්‍ය, ශරීර කොටස්, වැදෑ මස්, ආසාදනය වන සුළු හා අතිශයෙන් ආසාදනය වන සුළු අපද්‍රව්‍ය හා උල් කටුය.

''කාර්යාලය'' යන්නට 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාලය සේවා නියුක්තිකයන් පිළිබඳ පනතේ (129 වන අධිකාරය) දී ඇති අර්ථයම ඇත.

''සාප්පුව'' යන්නෙන් අදහස් කෙරෙන්නේ තොග හෝ සිල්ලර වෙළඳාම සඳහා භාණ්ඩ තබා ඇති ස්ථානයක් වන අතර ආහාර පාන අලවියට තබා ඇති ස්ථානයක් සහ බාබර් සාප්පුවක් හෝ රූපලාවන්‍ය සැලෝන් එකක් පවත්වාගෙන යනු ලබන ස්ථානද මීට ඇතුලත් වේ.

මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේ ය.

10 - 468/1

වයඹ පළාතේ පළාත් සභාව

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ, පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් ම විසින් සම්පාදනය කරනු ලැබූ, පහත දැක්වෙන කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඉහත කී වගන්තිය යටතේ මෙසේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

නගර සභා ආඥා පනතේ (255 වන අධිකාරිය) 153 වන වගන්තිය සමග කියවිය යුතු එකී ආඥා පනතේ 118 වගන්තිය සහ 157 වන වගන්තියේ 9 වන උප වගන්තියේ (ආ) සහ (ඇ) ඡේදයන්ගෙන් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට නගර සභාවට බලය පැවරී ඇති අතර 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ ප්‍රකාර, මෙම සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන වැළඳ ගැනීම සඳහා වයඹ පළාතේ නගර සභා වලට බලය පැවරී ඇත.

නීතිඥ ජේ. පී. දයාසිරි පද්ම කුමාර ජයසේකර,
වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලනය,
මානව සම්පත්, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්, පරිසර සංචාරක,
ආයෝජන සම්බන්ධීකරණ, සමුපකාර සංවර්ධන සහ ආහාර සැපයුම් හා බෙදා හැරීම් අමාත්‍ය.

2014 දෙසැම්බර් මස 04 වැනි දින,
කුරුණෑගල දී ය.

නගර සභා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ

අතුරු ව්‍යවස්ථාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ලෙස සඳහන් කරනු ලැබේ.

02. නාගරික සීමාවන් ඇතුළත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීථිවල, මංමාවත් වල ජනනය වන ඝණ අපද්‍රව්‍ය වෙන් කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

03. නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙකුම හෝ පදිංචිකරුවකුම තම පරිශ්‍රය අපද්‍රව්‍ය වලින් තොර සෞඛ්‍ය සම්පන්න හා ප්‍රසන්න තත්වයෙන් තබා ගත යුත්තේ ය.

04. නගර සභා ප්‍රදේශයේ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍රය ඇතුලත ජනනය වන්නාවූ අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන් කිරීම, ගබඩා කිරීම හා බැහැර කිරීම කළ යුත්තේ ය. නැතිනම් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලව කළ යුත්තේ ය.

05. (i) පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තම පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ ඝණ අපද්‍රව්‍ය අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයක් භාවිතා කරමින් හෝ දෛනිකව නැතිනම් ඊට වඩා අඩු කාලාන්තරයෙන් එක්රැස් කල යුත්තේ ය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වගාමී උප වගන්තිය අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන වලට අනුකූලව වෙන් කළ යුත්තේ ය. නැතිනම් එසේ කිරීමට සැලැස්විය යුත්තේ ය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය ගබඩා කිරීම හෝ මුද හැරීම සඳහා භාවිතා කරනු ලබන යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් බහාලුමක් මෙම අතුරු ව්‍යවස්ථාවේ වගන්තිවල කාර්යයන් සඳහා මනා තත්වයන්ගෙන් පවත්වා ගත යුතු වේ.

(iv) නගර සභා බල ප්‍රදේශය ඇතුළත 5(I) උප වගන්තියට අනුකූලව එක්රැස් වන කසල භාර ගැනීම සඳහා නගර සභාව විසින් පූර්ව දැනුම් දීමකින් අනතුරුව නිශ්චිත සේවාවක් පවත්වාගෙන යා යුතු අතර එකී (1) වන උප වගන්තියේම සඳහන් ආකාරයට එක්රැස් කරන ලද අපද්‍රව්‍ය නගර සභාව විසින් කලින් කළට තීරණය කර ප්‍රසිද්ධ කරනු ලැබූ නගර සභා බල ප්‍රදේශ තුළ ක්‍රියාත්මක වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ ක්‍රමයකට හා කාලසටහනට අනුකූලව හිමිකරු හෝ පදිංචිකරු විසින් භාර දිය යුත්තේ ය.

(v) හිමිකරු හෝ පදිංචිකරු නිවැසියන්ගේ, අමුත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ සෞඛ්‍යයට හෝ එම ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්වයට හානිකර හෝ අන්තරාකාරී වන අන්දමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැර කිරීම නොකළ යුත්තේ ය.

06. (i) කිසිම තැනැත්තෙක් වීථියකට, පාරකට, මංමාවතකට, පටු මාවතකට, මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජල මාර්ගයකට, රක්ෂිතයකට හෝ ජලාශයකට හෝ කළපුවකට හෝ ජල මූලාශ්‍රයකට හෝ මුහුදට අපද්‍රව්‍ය මුදහැරීම නොකළ යුත්තේ ය.

(ii) කිසියම් තැනැත්තෙක් නගර සභා ප්‍රදේශය තුළ විවෘත භූමියක පරිසරයට හානිකර වන අන්දමින් අපද්‍රව්‍ය පිළිස්සීම නොකළ යුත්තේ ය.

(iii) යම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙකු අංක 7 දරන වගන්තියේ විධිවිධාන ප්‍රකාර යම් අපද්‍රව්‍ය වර්ගයක් මුදහැරීම, පිරියම් කිරීම, සැකසීම හෝ බැහැරලීම සඳහා අවසර ලබා ගැනීමට සිදුවන අවස්ථාවකදී එසේ අවසර ගැනීමට අපොහොසත් වේ නම් ඔහුට එම අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) අංක 7 දරන වගන්තියේ විධිවිධාන යටතේ සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම හෝ නොකරනු ලැබූ අපද්‍රව්‍ය ඉහත 6 (iii) හි විධිවිධාන යටතේ යම් බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් කරන ලද යම් අපද්‍රව්‍ය වර්ගයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ වගන්තිවල විධිවිධානයන්ට අනුකූලව ඉවත් කරනු ලැබිය යුත්තේ ය.

07. (i) යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් හැර අපද්‍රව්‍ය එම පරිශ්‍රය ඇතුළත ම බැහැර කළ හැකිය.

(අ) නගර සභාව විසින් එවැනි අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කර ඇති ප්‍රදේශයන් හි

(ආ) නගර සභාව විසින් නිශ්චිතව නියම කරනු ලැබ ඇති ඇතැම් අපද්‍රව්‍ය වර්ග.

(ii) පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට ලේකම්වරයා විසින් අනුමත කරන ලද සැලසුමකට හා ප්‍රමිතියට අනුකූලව ඉදිකරනු ලැබූ දහනයක හෝ පෝරණුවක අපද්‍රව්‍ය පිළිස්සිය හැකිය. නැතිනම් ලේකම්වරයා විසින් අනුමත කරන ලද ආකාරයට අපද්‍රව්‍ය පිරියම් කිරීම, සැකසීම හෝ වැළලීම කල හැකිය.

(iii) යම් හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු ''කොම්පෝස්ට් බඳුන්'' සඳහා ලේකම්වරයා වෙතින් ඉල්ලීමක් කළහොත් ඒ හිමිකරුට හෝ පදිංචිකරුට එම කොම්පෝස්ට් බඳුන් නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් පරිශ්‍රය තුළ තිබේනම් ලේකම්වරයා එම කොම්පෝස්ට් බඳුන්වල පිරිවැයෙන් කොටසක් හෝ මුළුමනින් හෝ සහනාධාරයක් වශයෙන් ලබාදෙමින් එම කොම්පෝස්ට් බඳුන් හිමිකරුට හෝ පදිංචිකරුට සැපයිය හැකිය.

(iv) හිමිකරු හෝ පදිංචිකරු පරිශ්‍රය ඇතුළත එකතුවන 'ගෙවතු අපද්‍රව්‍ය' හැකිතාක් අදාළ පරිශ්‍රය තුළ මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලව බැහැර කිරීමට කටයුතු කළ යුතුය. අනතුරුව ඉතිරිවන යම් ගෙවතු අපද්‍රව්‍යක් වේ නම් එය

බැහැරලීමට ඇති අපද්‍රව්‍ය වල ස්වභාවය සැලකිල්ලට ගෙන නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි නියමිත ගාස්තුවක් ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට භාරදිය යුත්තේ ය.

(v) වීථියක හෝ මංමාවතක යාබදව පිහිටි යම් ගසක් හෝ ගසක කොටසක් කපන යම් තැනැත්තෙක් වහාම එය ඉවත් කළ යුත්තේ ය. නැතිනම් ඉවත් කිරීමට සැලැස්විය යුත්තේ ය. එසේත් නැතිනම් නගර සභාව විසින් තීරණය කරනු ලබන ගාස්තු ගෙවීමක් මත නගර සභාව වෙනුවෙන් කසල එක්රැස් කරනු ලබන අයට භාර දිය යුත්තේ ය.

(vi) සෑම තැනැත්තෙක්ම ඔහුගේ පාලනය යටතේ සිටින යම් සතෙකු වීථියක, මංමාවතක හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුත්තේය. එසේ මළපහ කරනු ලැබුවහොත් මෙම අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම ඒ තැනැත්තාගේ වගකීම වන්නේ ය.

(vii) කිසිම තැනැත්තෙක් නගර සභා ප්‍රදේශය තුළ කුමන වර්ගයක හෝ අපද්‍රව්‍යයක් වාහනයක සිට වීථියකට, මංමාවතකට හෝ පොදු ස්ථානයකට, ඇලකට, දෙළකට, ජල මූලාශ්‍රයකට, රක්ෂිතයකට හෝ කළපුවකට මුදහැරීම හෝ එහි තැන්පත් කිරීම හෝ නොකළ යුත්තේ ය.

(viii) නිවෙසක් හෝ වෙනත් යම් පරිශ්‍රයක් ඉදි කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට සැලැස්මක් අනුමත කරවා ගැනීමට අයදුම් කරන යම් කෙනෙක් ඔහුගේ පරිශ්‍රයේ ජනනය වන ඝණ අපද්‍රව්‍ය හා මුද හරිනු ලබන ද්‍රව්‍ය පිරියම් කරනු ලබන හා සකස් කරනු ලබන ආකාරය පිළිබඳ සැලසුම ඔහුගේ අයදුම්පත්‍රයේ ඇතුළත් කළ යුත්තේ ය.

නිවාස පරිශ්‍රයන්

08. (i) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයකින් එකතු කරනු ලැබූ අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රව්‍යකාරී අපද්‍රව්‍ය
(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචී
(ඉ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම එසේ තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම මලුවලට, බඳුන්වලට හෝ වෙනත් බහාලුම්වලට දැමීය යුතු අතර, ඒවා ඉවත් කරනු ලබන තෙක් ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයක තැබිය යුත්තේය. ආහාර අපද්‍රව්‍ය හා ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය තෙතමනය කාන්දු නොවන ද්‍රව්‍යයෙන් සාදනු ලැබූ සහ මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුළුවීම වළක්වමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක තැබිය යුත්තේය. සතුන්ගේ මළකුණු ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය, බැහැරලිය යුතු අපද්‍රව්‍යවල ස්වාභාවය සැලකිල්ලට ගෙන නගර සභා බල ප්‍රදේශය සඳහා කලින් කලට නගර සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් අය කිරීමෙන් පසුව පමණක් නගර සභාව විසින් අදාළ අපද්‍රව්‍ය භාර ගැනීම සිදු කළ යුතු ය.

(iii) සෑම හිමිකරුවෙකුටම හෝ පදිංචිකරුවෙකුටම 8 (i) උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. නොඑසේ නම් නගර සභාව විසින් එම අපද්‍රව්‍ය එක්රැස් කරන බහාලුමකට බැහැර කිරීම කළ යුත්තේය.

09. (i) කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැගිල්ලක සෑම අයිතිකරුවෙක්ම ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන අයුරු තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රව්‍යකාරී අපද්‍රව්‍ය
(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචී
(ඉ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) 9 (I) වන වගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු ඉහත (අ), (ආ) සහ (ඇ) යන අයිතමය යටතේ විස්තර කර ඇති අපද්‍රව්‍ය සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ ප්‍රමිතීන්ට පිරිවිතරයන්ට අනුකූල වූ බහාලුම් සපයාගත යුතු අතර ඒවා පවිත්‍රව හා සනීපාරක්ෂක තත්වයෙන් පවත්වාගත යුතු ය.

(iii) 9 (i) වන උප වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු (ii) වන උප වගන්තියේ විධිවිධාන වලට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවකදී ලේකම්වරයා විසින් දැනුම්දෙනු ලබන දිනයකදී හෝ ඊට පෙර අදාළ බඳුන් හෝ බහාලුම් සපයන ලෙසට හිමිකරුට හෝ පදිංචිකරුට නියම කිරීමට ලේකම්වරයාට බලය ඇත්තේය. ලේකම්වරයාගේ නියමයන් අනුව ක්‍රියා කිරීම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේ ය.

(iv) ගොඩනැගිල්ලේ බිමක හෝ මහලක හිමිකරු හෝ පදිංචිකරු තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාළ බඳුනකට හෝ බහාලුමකට දැමිය යුත්තේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 9(i) වන උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම බලයලත් එක්රැස් කරන්නෙකුගේ කාර්යය වන්නේ ය. එසේ ඉවත් කරනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් නගර සභාව විසින් ඒ සඳහා විශේෂයෙන් සකස් කර පවත්වාගෙන යනු ලබන ස්ථානයකට බැහැර කිරීම හෝ එසේ සභාව වෙනුවෙන් කසල එක්රැස් කරන්නෙකුට භාර දීම කළ යුත්තේ ය.

(vi) ඉහත 9 (i) (ඇ) අයිතමයෙහි සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත (අ), (ආ), (ඇ) සහ (ඉ) යන අයිතමයන් යටතේ මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර නිවාස පරිශ්‍රයේ අයිතිකරු, කුලී නිවැසියා හෝ පදිංචිකරු එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලයලත් කසල එක්රැස් කරන්නෙකුට විය යුතුය.

10. (i) නගර සභාවේ පූර්ව අනුමැතිය ලබාගෙන මුඩුක්කු නිවැසියන්ගේ භාවිතය සඳහා ලේකම්වරයා විසින් අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නොමිලයේ සැපයීම නීත්‍යානුකූල වේ.

(ii) සෑම මුඩුක්කු නිවසකම හිමිකරු හෝ පදිංචිකරු ඔහුගේ වාසස්ථානයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කර ඔහුගේ වාසස්ථානයට ආසන්නවම සපයනු ලබන අනුමත බඳුන්වලට හෝ බහාලුම්වලට දැමිය යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය

(iii) මේ අතුරු ව්‍යවස්ථාවේ 10 (ii) වන උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම පිණිස අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට අවසර දීම ලේකම්වරයාගේ කාර්යය විය යුත්තේ ය.

සාප්පු සහ කාර්යාල

11. (i) සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ කළමණාකරුවෙක්ම එක් එක් සංකීර්ණයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රිකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රව්‍යකාරී අපද්‍රව්‍ය
(ඈ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේ ය.

(iii) සාප්පුවක හෝ කාර්යාලයක හිමිකරුට හෝ කළමණාකරුට මෙම අතුරු ව්‍යවස්ථාවේ 11 (i) වන උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) මහල් කිහිපයකින් යුක්ත සාප්පු හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හෝ කළමණාකරු ලේකම්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම සාප්පුවෙන් හෝ කාර්යාලයෙන් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 11 (iv) වන උප වගන්තියේ විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති සාප්පුවක හෝ කාර්යාලයක යම් හිමිකරුවෙක් තෝරා වෙන් කරනු ලැබ අපද්‍රව්‍ය වෙන වෙනම බඳුන්වලට හෝ බහාලුම්වලට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට සෑම හිමිකරුවෙකුට සහ කළමණාකරුවෙකුට අයිතිවාසිකමක් ඇත.

(vi) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් නොකරන ලද මෙම අතුරු ව්‍යවස්ථාවේ 11 (i) වන උප වගන්තියේ (ඇ) අයිතමයේ සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් අය කිරීමෙන් පසු නගර සභාව වෙනුවෙන් කසල එක්රැස් කරන්නෙකු වෙත භාරදීම නීත්‍යානුකූල වන්නේ ය.

(vii) ඉහත (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත (අ), (ආ), (ඇ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමග මිශ්‍රවීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර කාර්යාල හා සාප්පු සංකීර්ණයක හිමිකරු හෝ කළමණාකරු එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

(viii) අසල්වාසීන්ට හෝ එකී සාප්පුවේ හෝ කාර්යාලයේ සේවයේ නියුතු තැනැත්තන්ට හෝ යම් සෞඛ්‍ය හෝ සනීපාරක්ෂක ගැටළුවක් ඇති නොවීම පිණිස අපද්‍රව්‍ය ඉවත් කිරීමත් මෙම අතුරු ව්‍යවස්ථාවේ විශේෂයෙන් නියම කර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නඩත්තු කිරීමත් යම් සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙකුගේම හෝ කළමණාකරුවෙක්ගේම වගකීම වන්නේ ය.

හෝටල්

12. (i) සෑම හෝටල්කරුවෙක්ම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තම පරිශ්‍රයේ එක්රැස් වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය. නැතහොත් එසේ කිරීමට සැලැස්විය යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රව්‍යකාරී අපද්‍රව්‍ය
(ඈ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) සෑම හෝටල්කරුවෙක්ම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තෙක් වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iii) සෑම හෝටල්කරුවෙක් හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතෙකු ඇතුළු වීම වළකමින් සියළුම ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද සහ පියනක් යොදා නිසි ලෙස ආරක්ෂාකාරී කරන ලද බඳුනක හෝ වෙනත් බහාලුමක ඇසිරිය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 12(i) වන උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 12 (iv) වන උප වගන්තිය යටතේ බාර ගනු නොලැබූ ඉහත (අ), (ආ) අයිතම යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍ය සභාව විසින් එවැනි කසල එක්රැස් කිරීම සඳහා විශේෂිතව තබන ලද බහාලුමකට හෝ නම් කරන ලද ස්ථානයට බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(vi) ඉහත (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත (අ), (ආ) සහ (ඇ) යන අයිතම යටතේ මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර සෑම හෝටල් හිමකරුවෙකුම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලයලත් කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

එළවළු සහ පළතුරු වෙළඳසැල්

13. (i) සෑම එළවළු සහ පළතුරු වෙළඳසැලකම හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා තම වෙළඳසැලේ එක්රැස්වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) මිනිස් පරිභෝජනයට නුසුදුසු එළවළු, පළතුරු හෝ වෙනත් යම් දිරන අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 13 (i) වන උප වගන්තියේ (අ) අයිතමයෙහි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යකින් සාදන ලද වෙනම බහාලුමක තැබිය යුතු අතර එය තුළට මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේ ය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු යම් බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 13(i) වන උප වගන්තියේ (අ), (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතුය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 13 (iii) වන උප වගන්තිය යටතේ භාර ගනු නොලැබූ ඉහත (අ), (ආ) ඡේද යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍ය සභාව විසින් එවැනි කසළ එක්රැස් කිරීම සඳහා විශේෂිතව පත් කරන ලද බහාලුමකට හෝ ස්ථානයකට බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

මස්, මාළු, හෝ බිත්තර වෙළඳ කුටි

14. (i) තත් කාර්යය සඳහා සභාපතිවරයා විසින් ඊට අදාළ යම් ලිඛිත නීතියක් යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ප්‍රකාර එහි සඳහන් ස්ථානයේදී කිසිම තැනැත්තෙක් ගෝඝාතක ආඥා පනතේ විධිවිධාන යටතේ අවසරලත් සතුන් හැරුනුවිට වෙනත් කිසිම සතෙකු හෝ ඝාතනය නොකළ යුත්තේ ය.

(ii) මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යාපාරය කරගෙන යන අය හෝ ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) මිනිස් පරිභෝජනයට නුසුදුසු සත්ව මළකුණු හෝ මළකුණුවල කොටස් බිත්තර හෝ වෙනත් දිරන අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම භාජනයක හෝ වෙනත් බහාලුමක් තුළට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ 14 (ii) වන උප වගන්තියේ (අ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන බහාලුමක් ඇතුලත තැබිය යුතු අතර එම බහාලුමට මැස්සන්, මීයන්, කෘමීන් හෝ වෙනත් සතුන් ඇතුලුවීම වළකමින් එය නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (ii) වන වගන්තියේ (අ), (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග අවසර ලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දිය යුතුය. එසේ භාරදෙනු නොලැබූ ඉහත (අ), (ආ) ඡේද යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍යයක් නගර සභාව විසින් පවත්වාගෙන යන කසල එක්රැස් කරන තැනැත්තෙකුට භාරදීම හෝ ස්ථානයකට බැහැර කිරීම කළ යුත්තේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 14 (iv) වන උප වගන්තිය යටතේ භාර ගනු නොලැබූ ඉහත (අ), (ආ) ඡේද යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍ය නගර සභාව විසින් එවැනි කසල එක්රැස් කිරීම සඳහා විශේෂිතව පත් කරන ලද බහාලුමකට හෝ ස්ථානයකට බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

පදික වෙළඳාම හෝ සංචාරක වෙළඳාම

15. (i) අපද්‍රව්‍ය ජනනය වන්නාවූ ව්‍යාපාරයක් පවත්වාගෙන යන සෑම සංචාරක හෝ පදික වෙළෙන්දෙකුම, ඊට අදාළව යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ විධිවිධාන සලසා ඇති පරිදි හා ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක් තබාගත යුත්තේ ය. එවැනි කිසිම අපද්‍රව්‍යයක් පදික වේදිකාවේ, මහා මාර්ගයේ හෝ ජල කානුවකට හෝ පොදු ස්ථානයකට නොදැමිය යුත්තේ ය.

(ii) සෑම පදික හෝ සංචාරක වෙළෙන්දෙක්ම වාහනවල ගමනාගමනයට හෝ පදිකයින්ගේ ගමනාගමනයට බාධා ඇති වන ආකාරයෙන් බඳුනක් හෝ වෙනත් බහාලුමක් නොතැබිය යුත්තේ ය.

(iii) සෑම පදික හෝ සංචාරක වෙළෙන්දෙක්ම ඔහුගේ ව්‍යාපාරය හේතුවෙන් ජනනය වන්නාවූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය සහ වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය

(iv) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම බඳුනක් හෝ වෙනත් බහාලුමක් තුළට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ 15 (iii) උප වගන්තියේ (අ) අයිතමයේ සඳහන් කර ඇත්තා වූ අපද්‍රව්‍ය කෘමීන්, මීයන් හෝ වෙනත් සතුන් විසින් කා දැමීමට නොහැකි වන පරිදි ආරක්ෂාකාරී බහාලුමක අභ්‍යන්තරයේ තැබිය යුතු අතර අමතර අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය වන විට හැර එය වසා තැබිය යුත්තේ ය.

(v) සෑම පදික වෙළෙන්දෙක්ම හෝ සංචාරක වෙළෙන්දෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ 15 (iii) වන උප වගන්තියේ (අ) හා (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍යය එක්රැස් කරන්නෙකුට භාර දිය යුතුය.

(vi) ඉහත (iii) (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත (අ), (ආ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමග මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර පදික වෙළෙන්ද හෝ සංචාරක වෙළෙන්ද එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය ලබා දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතුය.

(vii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (v) වන උප වගන්තිය යටතේ භාරගනු නොලැබූ ඉහත (අ), (ආ) අයිතම යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍ය සභාව විසින් එවැනි කසල එක්රැස් කිරීම සඳහා විශේෂිතව තබන ලද බහාලුමකට හෝ ස්ථානයකට බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය. සෑම සංචාරක/පදික වෙළෙන්දෙක්ම අපද්‍රව්‍ය බඳුන් නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දීමට පෙර නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවිය යුත්තේ ය.

කර්මාන්ත ශාලා

16. (i) සෑම කර්මාන්ත ශාලා හිමිකරුවෙක්ම හෝ නිෂ්පාදකයෙක්ම කර්මාන්තශාලා පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කර පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය
(ඈ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 16 (1) යන උප වගන්තියේ (අ), (ආ) හා (ඈ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ගාස්තුවක් නගර සභාව වෙත ගෙවීම මත නගර සභාවේ කසල එක්රැස් කරන්නෙකුට භාර දීම කළ යුතු ය.

(iii) වයඹ පළාතේ 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසි වලට අනුකූලව උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉවත් කළ යුතු වන්නේ ය.

(iv) ඉහත 16 (i) (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍යය ඉහත (අ), (ආ); (ඈ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමග මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර කර්මාන්ත ශාලා හිමිකරු හෝ ඔහු විසින් බලය දී ඇති තැනැත්තා එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය ලබා දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

කැනීම්, ඉදිකිරීම් සහ කඩා දැමීම

17. (i) යම් වීථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කනින හෝ යම් නිර්මාණයක් ඉදිකරන හෝ කඩාදමන සෑම තැනැත්තෙක්ම එමඟින් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය සුදුසු ආකාරයකින් එකී පරිශ්‍රයෙන් ඉවත් කරන තෙක් පරිශ්‍රය ඇතුළත හෝ ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ස්ථානයක හෝ ගබඩා කළ යුත්තේ ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 17 (i) වන උප වගන්තියේ සඳහන් වන අපද්‍රව්‍ය නගර සභාව විසින් කලින් කළට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත නගර සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

ආරෝග්‍යශාලා

18. (i) ආරෝග්‍යශාලාවක භාරකරු පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) සායනික අපද්‍රව්‍ය
(ඈ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය
(ඉ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) 18 (i) වන උප වගන්තිය යටතේ (අ) සහ (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුතු අතර, එකී අපද්‍රව්‍ය නගර සභාව විසින් ඒ සඳහා විශේෂයෙන් සලසා ඇති වැඩපිළිවෙලක් යටතේ කසල එක්රැස් කරනු ලබන අවස්ථාවක නගර සභාව වෙනුවෙන් එසේ කසල එක්රැස් කරන්නා වෙත භාර දිය යුතුය. අ (i) (ඉ) අයිතමය යටතේ සඳහන් කර ඇති අපද්‍රව්‍ය නගර සභාව විසින් කලින් කළ තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසු ඒ සඳහා විශේෂිත කසල එක්රැස් කරනු ලබන ආකාරයට නගර සභාව වෙනුවෙන් කසල එක්රැස් කරන්නා වෙත භාර දිය යුතුය.

(iii) 18 (i) උප (ඇ), (ඈ) අයිතම යටතේ එකතුවන අපද්‍රව්‍ය කවර ආකාරයකින් හෝ වෙනත් අපද්‍රව්‍ය සමග මිශ්‍ර නොකළ යුතු අතර එකී අපද්‍රව්‍ය වයඹ පළාතේ 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසි වලට අනුකූලව බැහැර කළ යුත්තේ ය.

පෞද්ගලික රෝහල් හා රසායනාගාර

19. (i) පෞද්ගලික රෝහලක හෝ රසායනාගාරයක හිමිකරු හෝ අයිතිකරු තම ආයතනය තුළ ජනනය වන්නාවූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය

(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය

(ඇ) සායනික අපද්‍රව්‍ය

(ඈ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය

(ඉ) පරිශ්‍රය අතු ගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) 19 (i) වන උප වගන්තිය යටතේ (අ) සහ (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුතු අතර එකී අපද්‍රව්‍ය නගර සභාව විසින් ඒ සඳහා විශේෂයෙන් සලසා ඇති වැඩ පිළිවෙළක් යටතේ කසළ එක්රැස් කරන අවස්ථාවක නගර සභාව වෙනුවෙන් එසේ කසළ එක්රැස් කරන්නා වෙත භාර දිය යුතු ය.

(iii) 19 (i) උප වගන්තියේ (ඉ) අයිතමය යටතේ සඳහන් කර ඇති අපද්‍රව්‍ය නගර සභාව විසින් කලින් කළ තීරණය කරන ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසු එක්රැස් කරන්නා වෙත භාරදිය යුතුය.

(iv) ඉහත (ඇ), (ඈ) අයිතම යටතේ එකතු වන අපද්‍රව්‍ය කවර ආකාරයකින් හෝ වෙනත් අපද්‍රව්‍ය සමග මිශ්‍ර නොකළ යුතු අතර එකී අපද්‍රව්‍ය 1990 අංක 121 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්ති යටතේ නිකුත් කරනු ලැබූ පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසි වලට අනුකූලව බැහැර කළ යුත්තේ ය.

වෙනත් පරිශ්‍රයන්

20. (i) අංක 8 සිට 18 දක්වා වන වගන්තිවල විශේෂයෙන් සඳහන් කර නොමැති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙක් හෝ මහජනතාවගේ සහභාගිත්වය ඇතිව පොදු, ආගමික, සාමාජීය, සංස්කෘතික හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධානය කරන හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක් එකී ක්‍රියාකාරකම නිසා හෝ එවැනි ආයතනයක් පවත්වාගෙන යාම නිසා ජනනය වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය

(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය

(ඈ) පරිශ්‍රය අතු ගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) 20 (i) වන උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන පුද්ගලයෙක් එම ක්‍රියාකාරකම නිසා ජනනය වන්නාවූ අපද්‍රව්‍ය එක්රැස් කිරීමට විශේෂ වැඩපිළිවෙලක් යෙදීමට හැකිවනු පිණිස ඒ ගැන කල්තියා නගර සභාවට දැනුම්දිය යුත්තේ ය.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරගනු ලබන තෙක් වෙනම බහාලුම්වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 20 (i) වන උපවගන්තියේ (අ), (ආ) හා (ඇ) යන අයිතම යටතේ එක්රැස් වන අපද්‍රව්‍ය නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබූ පරිදි ප්‍රකාශයට පත් කර ඇති ගාස්තුවක් අය කර නගර සභාව විසින් බලය දී ඇති කසළ එක්රැස් කරන්නෙකු විසින් භාර ගැනීම නිත්‍යානුකූල වන්නේ ය.

(v) එසේ වුවද කිසියම් වූ ආගමික ස්ථානයක ආගමික කාර්යයක් වශයෙන් වානිජ පරමාර්ථයකින් තොරව පවත්වාගෙන යනු ලබන කවර ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් වුවද එකී ක්‍රියාකාරකම් හේතුවෙන් එක්රැස් වන ඉහත (i) උප වගන්තියේ (අ), (ආ) සහ (ඇ) යන අයිතමයන් යටතේ එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බැහැර කරලීම සම්බන්ධයෙන් ඉහත (iv) වන උප වගන්තියේ සඳහන් නගර සභාව විසින් කලින් කළ තීරණය කරන ලද ගාස්තුවක් අය කිරීම යන්න අදාළ නොවේ.

(vi) ඉහත (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍යය ඉහත (අ). (ආ) සහ (ඇ) යන අයිතම යටතේ මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලයලත් කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

වීථි සහ පොදු ස්ථාන

21. (i) නගර සභාව විසින් තීරණය කරන ආකාරයට සභාපතිවරයා විසින් පහත දක්වෙන කාර්යයන් සැලසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුත්තේ ය.

(අ) නගර සභා ප්‍රදේශය තුළ පිහිටි වීථි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළඳ පොළවල් පිරිසිදු හා සනීපාරක්ෂක තත්වයෙන් පවත්වා ගැනීම.

(ආ) නගර සභා බල ප්‍රදේශයේ කසල තාවකාලිකව එක්රැස් කිරීමට යථායෝග්‍යයැයි හඳුනාගන්නා ස්ථානයන්හි ප්‍රමාණවත් බක්කි සංඛ්‍යාවක් සවි කිරීම හා නඩත්තු කිරීම.

(ඇ) උත්සවවලදී, විශේෂ සිදුවීම් අවස්ථාවලදී හෝ නගර සභාව විසින් තීරණය කරනු ලබන සිදුවීම් අවස්ථාවල දී නගර සභාවෙන් තීරණයක් කරන විටකදී හෝ එකී උත්සව හෝ විශේෂ සිදුවීම් අවස්ථා සංවිධායකවරුන්ගේ ඉල්ලීමක් මත හෝ පොදු ස්ථානයන්හි භාවිතය සඳහා ජංගම අපද්‍රව්‍ය බක්කි සැපයීම.

(ඈ) කසල තාවකාලික එක්රැස් කිරීමට යථායෝග්‍ය යැයි හඳුනාගෙන ඇති ස්ථානවල සවි කර ඇති පොදු අපද්‍රව්‍ය බක්කි හෝ බහාලුම් සනීපාරක්ෂක තත්වයෙන් පවත්වා ගැනීම සහ ඒ ආසන්නයේ පදිංචි වැසියන්ට එය පීඩාවක් වීමට පෙර එම බක්කිවල හා බහාලුම්වල තැන්පත් කර ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම.

(ඉ) පූර්වගාමී වගන්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශන කිරීම හා අප්‍රමාදව ඒ ගැන ක්‍රියා කිරීම.

(ii) නගර සභාව විසින් විශේෂයෙන්ම එක් එක් අපද්‍රව්‍ය සඳහා වෙන් කරනු ලැබූ බක්කියක ඊට අදළ නොවන අපද්‍රව්‍ය තැන්පත් කිරීම කිසිම තැනැත්තෙක් නොකළ යුත්තේ ය.

නගර සභාවේ යුතුකම්

22. (i) ලේකම්වරයා විසින් සභාපතිවරයා සමග සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දක්වෙන කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ හැක්කේ ය.

(අ) අපද්‍රව්‍ය අඩු කිරීමට, ප්‍රතිභාවිතයට හා ප්‍රතිචක්‍රීකරණයට ජනතාව ධෛර්යමත් කිරීම.

(ආ) අපද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, එක්රැස් කිරීම, ගබඩා කිරීම, මුදහැරීම හා බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මගින් ප්‍රචාරණය කිරීම.

(ඇ) ප්‍රතිභාවිතාකරණ හා ප්‍රතිචක්‍රීකරණ කටයුතුවල නියුක්ත පුද්ගලයින්ට හා කුඩා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම.

(ඈ) අපද්‍රව්‍ය අඩු කිරීමේ, ප්‍රතිභාවිතා කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම් වලට සම්බන්ධ වී සිටින අයට දිරි ගැන්වීම් පිරිනැමීම.

(ඉ) අපද්‍රව්‍ය මුදහැරීමේ ක්‍රම පිළිබඳ වෙනත් ආකෘති නියාමනය කිරීම.

(ඊ) නගර සභා බල ප්‍රදේශයේ එක් එක් ප්‍රදේශයන්හි එක් එක් අපද්‍රව්‍ය වර්ග සඳහා සභාව විසින් තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්කාසු කරන දිනයන්, වේලාවන්, ක්‍රමවේදයන් හා ගාස්තු සඳහන් කරමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ කාලසටහනක් පිළියෙළ කිරීම සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන් හි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා වන කොන්දේසි එම කාලසටහනේ ඇතුළත් කිරීම.

(උ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට වෙනම භාරදෙනු නොලැබූ යම් වෙන් කරන ලද අපද්‍රව්‍ය කාල සටහනට අනුව නියමිත වේලාවට එක්රැස් කිරීම.

(ඌ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදෙනු නොලැබූ අන්තරායකාරී අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහනය කිරීම.

(එ) අන්තරායකාරී අපද්‍රව්‍ය හෝ ලේකම්වරයා විසින් නියම කරන ලද වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර වීථි අතුගෑමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය පොදු බක්කිවලින් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය සහ නගර සභාවේ කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දීම හෝ නගර සභාව විසින් විධිමත් පරිදි බැහැර කිරීමට කටයුතු කිරීම.

(ඒ) ආහාර සහ වෙනත් ජෛව ජීරණනීය ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය ප්‍රායෝගිකව කළ හැකි තාක් මුළුමනින්ම හෝ කොටසක් හෝ සැකසීමට හා පිරියම් කිරීමට වැඩ පිළිවෙලක්ද ඇතුළත්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නන් විසින් එක්රැස් කරනු ලබන වෙන් කරන ලද අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ එම ක්‍රියාවලියෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ගවල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය ලේකම්වරයා අනුමත කරන ආකාරයට බැහැරලීමට යෝග්‍ය පියවර ගැනීම.

(ඔ) වයඹ පළාත් පරිසර අධිකාරිය සමග සියලු අන්තරායකාරී අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් සියළු කටයුතු නියාමනය කිරීම.

(ඕ) 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියේ විධිවිධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීම සහ එම බල පත්‍රයේ හෝ පරිසර ආරක්ෂණ බල පත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති කොන්දේසිවලට යටත්ව අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂක බිම් පිරවුමක් පවත්වාගෙන යාම හෝ ඒ හා සම්බන්ධ වෙනත් විධිමත් විකල්ප ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.

(ක) අපද්‍රව්‍ය අතුගෑම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම හා බැහැරලීම යන කාර්යයන් හි නිරතවන සෑම සේවකයෙකුටම පිරිසිදුකාරක ද්‍රව්‍ය, සුදුසු ඇඳුම්, අත් ආවරණ, මුඛ ආවරණ සහ බූට් සපත්තු සැපයීම හා එකී සේවකයින් සඳහා සෞඛ්‍ය රක්ෂණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම හා වසරකට දෙවරකට නොවැඩි සෞඛ්‍ය සායන පැවැත්වීම.

(ග) නගර සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.

(ජ) 2000 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ පිළිබඳ ජාතික උපාය මාර්ගය සහ අදාළ නීතියට හා 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියට අනුකූලව සවිස්තර වශයෙන් යටත් පිරිසෙයින් එක් එක් ලිත් වර්ෂයක් ආවරණය කරන හා අවසාන බැහැරලීම සම්බන්ධයෙන් වර්ෂ 03 ක් ඉදිරියට ආවරණය කරන ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම හා එම සැලැස්ම එය ආවරණය කරන කාලසීමාව අනුව නිරන්තර පදනම මත නගර සභාව විසින් වාර්ෂිකව එය අනුමත කරනු ලැබීම.

(ට) (අ) සිට (ජ) දක්වා අයිතමයන්හි සඳහන් වන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලැබෙන යම් පැමිණිල්ලක් එය අදාළ වන්නේ උද්ගත විය හැකි පීඩාවකට නම් දින තුනක් ඇතුලතත් වෙනත් පැමිණිල්ලක් නම් දින දහතරක් ඇතුළතත් විමර්ශනය කිරීම හා වහාම අවශ්‍ය කටයුතු කිරීම.

අවසර පත්‍රය

23. (i) අපද්‍රව්‍ය ප්‍රතිභාවිතයට ගන්නා වූ හා ප්‍රතිචක්‍රීකරණය කරන්නා වූ හෝ කොම්පෝස්ට්, ජීව වායු හෝ වෙනත් නිපැයුම් නිර්මාණය කරන්නා වූ යම් තැනැත්තෙක් හෝ තැනැත්තන් පහත දක්වෙන කරුණු සපුරාලන්නේ නම් ඔහුට සභාව විසින් අවසරපත්‍රයක් නිකුත් කරනු ඇත.

(අ) නගර සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා නගර සභා බල ප්‍රදේශය ඇතුළත හෝ වෙනත් පළාත් පාලන ආයතන ප්‍රදේශයක හෝ යම් ව්‍යාපාරයක් කරගෙන යාම.

(ආ) 1990 අංක 12 දරන වයඹ පළාත් පරිසර ප්‍රඥප්තිය යටතේ විධිවිධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම.

(ඇ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා නගර සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතින්ට අනුකූලව ඉදිකරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන තිබීම.

(ඇ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන පරිදි හා ජනතාවට පීඩාවක් සිදු නොවන සනීපාරක්ෂක ක්‍රමයකට ප්‍රවාහනය කිරීම සඳහා වාහන තිබීම.

(ඉ) අදාළ ව්‍යාපාරය නගර සභා සීමාවක් ඇතුළත කරගෙන යනු ලබන විටෙක දී නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා ගාස්තුවක් නගර සභාවට ගෙවීම මත අපද්‍රව්‍ය සැකසීමේදී හෝ පිරියම් කිරීමේදී අවශේෂ වන්නාවූ හෝ ප්‍රතික්ෂේප වන්නා වූ හෝ අතුරු නිෂ්පාදන වශයෙන් නිර්මාණය කෙරෙන්නාවූ අපද්‍රව්‍ය නගර සභාව විසින් අනුමත කරනු ලබන පරිදි නගර සභාවට භාර දීමට එකඟ වීම.

(ii) නගර සභාව අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ විටෙක හෝ නිෂ්ප්‍රභා කළ විටෙක ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත් එසේ ප්‍රතික්ෂේප කිරීමට හා නිෂ්ප්‍රභා කිරීමට හේතු අවසර පත්‍රය සඳහා ඉල්ලුම් පත්‍රය ලැබී දින 30 ක් ඇතුළත ලිඛිතව ඉල්ලුම්කරුට දැනුම් දිය යුත්තේ ය.

(iii) ලේකම්වරයා විසින්, වලංගු කාල පරිච්ඡේදය තුළ එක් රැස් කිරීමට අවසර දෙනු ලබන අපද්‍රව්‍ය වර්ගය හෝ වර්ග එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසර දෙනු ලබන ප්‍රදේශය සහ වෙනත් සුදුසු කොන්දේසි අවසර පත්‍රයේ දැක්විය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 23 (i) වන උප වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා නොකරන අවස්ථාවකදී මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය අවලංගු කළ යුත්තේ ය.

(v) 23 (iv) වන උප වගන්තියේ විධිවිධාන යටතේ අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවකදී කිසියම් තැනැත්තෙක් අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ ලබාගැනීම හෝ නොකළ යුත්තේ ය. එවැනි අවස්ථාවකදී අවසර පත්‍රය අවලංගු කරනු ලැබූ බවට ජනතාව දැනුවත් කිරීම පිණිස ලේකම්වරයා මාධ්‍ය මගින් හෝ වෙනත් ක්‍රමයකින් ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදිය යුත්තේ ය.

අපද්‍රව්‍ය බැහැරලන ප්‍රදේශ

24. නගර සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීමේ කාර්යයන් සඳහා වෙන් කරන ලද ප්‍රදේශ වලට අවසර නොලත් තැනැත්තෙක් ඇතුළු නොවිය යුතු හා එහි නොගැවසිය යුතු අතර, එම ප්‍රදේශයේ යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඉවතලන දෙයක් තැන්පත් කිරීම, අවුල් කිරීම, හෝ ඉවත් කිරීම නොකළ යුත්තේ ය. කිසිම තැනැත්තෙක් විශේෂයෙන් නියම කරනු ලබන කොන්දේසි වලට යටත්ව නගර සභාව විසින් අවසර දෙනු ලැබුවහොත් මිස නගර සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි යම් තහනම් කරන ලද අපද්‍රව්‍ය තැන්පත් කිරීම නොකළ යුත්තේ ය.

25. අනුමත කිරීමේ යම් කොන්දේසිවලට යටත්ව ලේකම්වරයාගේ සහ වයඹ පළාත් පරිසර අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව මිස කිසිම තැනැත්තෙක් නගර සභා සීමාවන් ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ පහසුකමක් එයට පිටස්තර ස්ථානයක ජනනය වන්නාවූ අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා සැපයීම හෝ භාවිතා කිරීම නොකළ යුත්තේ ය.

26. අපද්‍රව්‍ය බැහැර කරනු ලබන කවර ස්ථානයන් වුවද එකී ස්ථානයට නැතහොත් ඉඩමට මායිම් වන සීමාව තාප්පයක් හෝ ඒ සඳහා සුදුසු ආවරණයක් මගින් සීමා කර තිබිය යුතු අතර එකී ස්ථානයට හෝ ඉඩමට බැහැර වන කැලිකසල සුළඟ, ජලය වැනි කාරණා හේතු කොටගෙන යාබද ඉඩම් හෝ ප්‍රදේශ වෙත යොමු වීමට නොහැකි වන ආකාරයට පවත්වාගෙන යායුතු ය.

වෙනත්

27. (i) සභාපතිවරයා හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට සියළු සාධාරණ වේලාවන්හීදී යම් පරිශ්‍රයකට ඇතුළත් වීමට සහ එහි හිමිකරු හෝ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන්නේ දැයි පරීක්ෂා කර බැලීමට බලය ඇත්තේ ය.

(ii) එම පරිශ්‍රයේ හිමිකරු, පදිංචිකරු, භාරකරු, කළමණාකරු හෝ එහි වාසය කරන්නාවූ හෝ සේවය කරන්නාවූ යම් තැනැත්තෙක් සභාපතිවරයාට හෝ ඔහුගේ යම් බලයලත් නිලධාරියෙකුට අවශ්‍ය කරන තොරතුරු ඉදිරිපත් කළ යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ සභාපතිවරයා ඔහුගේ බලයලත් නිලධාරියෙකුට සිය බලතල භාවිතා කිරීමෙහිලා කිසිම තැනැත්තෙක් බාධා නොකළ යුත්තේ ය.

දණ්ඩන

28. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කවර හෝ වගන්තියක් උල්ලංඝනය කිරීම වරදකරු වන අතර එම වරද සම්බන්ධයෙන් බලය ලත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු නගර සභාආඥා පනතේ අංක 153 දරන වගන්තිය යටතේ සඳහන් දණ්ඩන සීමාවන් යටතේ දඬුවම් ලැබිය යුතු යි.

අර්ථ නිරූපණය

29. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

"අපද්‍රව්‍ය හෝ ඝන අපද්‍රව්‍ය" යන්නෙන් ඒවා ඉවත දමු තැනැත්තාට පරිභෝජන වටිනාකමක් නොමැති ද්‍රව්‍ය අදහස් වන අතර රොඩු, කසළ, විථී ශුද්ධ කිරීමේ එකතුවන ද්‍රව්‍ය, දූවිලි, පස්, මඩ සහ අළු ද අදහස් කෙරේ.

"ආහාර අපද්‍රව්‍ය" යන්නෙන් මිනිස් පරිභෝජනය සඳහා පාවිච්චියට ගත නොහැකි ආහාර ද්‍රව්‍ය අදහස් කෙරේ.

"උපද්‍රවකාරී අපද්‍රව්‍ය" යන්නෙන් මහජන සෞඛ්‍යයට හෝ පරිසරයට හානි දයක වන විෂ සහිත, දැවෙන සුළු, ප්‍රතික්‍රියා දක්වන සුළු, රෝග කාරක, විකිරණශීලි ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

"එක් රැස් කිරීම" යන්නෙන් බලයලත් එක්රැස් කරන්නෙකු හෝ නගර සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් ප්‍රතිචක්‍රීකරණය, සැකසීම, පිරියම් කිරීම.

"කොම්පෝස්ට්" යන්නෙන් කාබනික අපද්‍රව්‍ය ක්ෂුද්‍රජීවී ජීර්නයට ලක්වීමෙන් පසුව ලැබෙන අවසන් නිමැවුම අදහස් කෙරේ. එය පාංශු තත්වාරක්ෂකයක් ලෙස ක්‍රියාකළ හැකි හියුමස් ද්‍රව්‍යයකි.

සභාපතිවරයා :- නගර සභාව සඳහා තේරීපත්වී ඇති සභාපතිවරයා

"ලේකම්" යන්නෙන් නගර සභා බල ප්‍රදේශයේ සම්බන්ධයෙන් වන විට නගර සභා පනත යටතේ එම නගර සභා බල ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද නගර සභාවේ ලේකම්වරයා අදහස් කෙරෙන අතර එම නගර සභාවේ ලේකම්වරයා වෙනුවෙන් වැඩ බැලීමට පත් කරන ලද යම් තැනැත්තෙකු සහ නගර සභා පනත යටතේ ලේකම්වරයාගේ බලතල යුතුකම් හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට බලය දෙනු ලැබූ එකී සභාවේ යම් නිලධාරියෙකු එම නිලධාරියාට එම බලය දෙනු ලැබ ඇති ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"ගබඩා කිරීම" යන්නෙන් හිමිකරුවකුගේ හෝ පදිංචිකරුවකුගේ පරිශ්‍රය ඇතුළත හෝ අනුමත පොදු එක්රැස් කිරීමේ ස්ථානයක අපද්‍රව්‍ය තැබීම හෝ තැන්පත් කිරීම අදහස් කෙරේ.

"ගාස්තුව" යන්නෙන් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන කිසියම් ගාස්තුවක් අදහස් කෙරේ.

"ගෙවතු අපද්‍රව්‍ය" යන්නෙන් ගෙවත්තක පිහිටි ගස්වලින් හෝ පැළවලින් ඉවත් කෙරෙන ශාඛ කොටස් සහ ගෙවත්තකින් ඉවත් කරනු ලබන ගල්, පස් ආදිය අදහස් කෙරේ.

"ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය" යන්නෙන් ක්ෂුද්‍ර ජීවී කාරකයන් මගින් දිරාපත් කරනු ලැබිය හැකි. අපද්‍රව්‍ය අදහස් කෙරේ.

"පොදු ස්ථානය" යන්නෙන් පාරක්, පිට්ටනියක්, පොදු ඉඩමක්, මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිටියක්, පොදුගොඩනැගිල්ලක්, සුසානභූමියක්, බස්නැවතුම්පළක්, දුම්රිය ස්ථානයක්, ගඟක්, ඇළක්, දෙළක්, විලක්, ජලාශයක්, පොකුණක්, තටාකයක්, කලපුවක්, අතු ගඟක්, ජල මාර්ගයක්, මුහුදු, මුහුදු වෙරළ හෝ මහජනතාව විසින් පොදුවේ පාවිච්චි කරනු ලබන වෙනත් ස්ථානයක් අදහස් කෙරේ.

"ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය" යන්නෙන් අපද්‍රව්‍ය තවදුරටත් අපද්‍රව්‍ය වශයෙන් හඳුනාගත නොහැකි වන පරිදි එහි ස්වරූපය වෙනස් කරමින් නව පාරිභෝජනය නිෂ්පාදනයන් කිරීමට යොදගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''ප්‍රවාහනය'' යන්නෙන් මිනිස් සත්ව හෝ යාන්ත්‍රික බලයකින් ක්‍රියා කරන යම් ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයක් යොද ගනිමින් අපද්‍රව්‍ය එක්රැස් කරනු ලබන ස්ථානයේ සිට ඒවා සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම සඳහා ඇති ස්ථානය වෙත ගෙන යාම අදහස් කෙරේ.

''බක්කිය/බඳුන් හෝ වෙනත් බහාලුම්'' යන්නෙන් අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව අපද්‍රව්‍ය ගබඩා කිරීම, මුදහැරීම, එක්රැස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් ආවරණයක් සහිත වූ බක්කියක්, බඳුනක් හෝ උරයක්, මල්ලක් හෝ වෙනත් බහාලුමක් අදහස් කෙරේ.

''බලයලත් එක් රැස් කරන්නා'' යන්නෙන් අපද්‍රව්‍ය එක්රැස් කිරීමට හෝ ලබාගැනීමට ලේකම්වරයාගෙන් අවසර පත්‍රයක් ලබා ගන්නා තැනැත්තෙකු අදහස් කෙරේ.

''බලයලත් නිලධාරි'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වන රාජකාරි ඉටු කිරීමට හෝ කරගෙන යාමට අවස්ථාවෝචිතව නගරාධිපතිවරයා හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකු අදහස් කෙරේ.

''බැහැරලීම'' යන්නෙන් ප්‍රතිභාවිත නොකරන ලද්දවුත්, ප්‍රතිචක්‍රීකරණය නොකරන ලද්දාවුත්, සැකසුම් නොකරන ලද්දවුත්, පිරියම් නොකරන ලද්දවුත් සියළුම අපද්‍රව්‍ය ස්ථිරවම රැඳවීමට අදහස් කරනු ලබන ඉඩමෙක මතුපිට හෝ ඇතුළත හෝ තැන්පත් කිරීම අදහස් කෙරේ.

''මාරු කරන ස්ථානය'' යන්නෙන් සභාව විසින් මේ කාර්යය සඳහා නියම කරනු ලබන ස්ථානයක් අදහස් කෙරෙන අතර ඒ ස්ථානයෙහි සිට යම් ප්‍රතිචක්‍රීකරණ, සැකසුම් කරන, පිරියම් කරන හෝ බැහැරලීම කරන පහසුකමක් වෙත අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා අපද්‍රව්‍ය වඩා කුඩා ප්‍රමාණයේ වාහනවලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහනවලට මාරුකිරීම එහිදී සිදු කෙරේ.

''තැනැත්තා'' යන්නෙන් සංස්ථාගත හෝ සංස්ථාගත නොවන සමාගමක් හෝ පුද්ගලයින්ගේ සමිතියක් හෝ මඩුල්ලක් හෝ යම් පුද්ගලයෙක්ද අදහස් කෙරේ.

''නගර සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නා'' යන්නෙන් බක්කිවලින් හෝ බහාලුම්වලින් අපද්‍රව්‍ය අතුගා දැමීම, එක්රැස් කිරීම, ලබාගැනීම හෝ ඉවත් කිරීම සඳහා සභාව විසින් යොදවනු ලැබූ සේවකයෙකු හෝ මේ කාර්යයන් ඉටු කිරීමට සභාව සමග කොන්ත්‍රාත්තුවකට ඇතුළු වී සිටින තැනැත්තෙක් අදහස් කෙරේ.

''වෙන් කිරීම'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යොද ඇති ප්‍රභේදයන්ට අනුකූලව අපද්‍රව්‍ය විවිධ වර්ගවලට තෝරා වෙන් කිරීම අදහස් කෙරේ.

''සැකසීම'' යන්නෙන් අපද්‍රව්‍ය ප්‍රයෝජනයට නිපැයුමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය අදහස් කෙරේ.

''සභාව'' යන්නෙන් 255 අධිකාරිය වූ නගර සභා ආඥපනත යටතේ සංස්ථාපනය කරන ලද නගර සභාවක් අදහස් කෙරේ.

''නගර සභා බල ප්‍රදේශය'' යන්නෙන් නගර සභා ආඥපනත යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදේශය අදහස් කෙරේ.

''සනීපාරක්ෂක බිම් පිරවීම'' යන්නෙන් ඒ හා ආශ්‍රිත සාමජයීය, සෞඛ්‍ය සහ පාරිසරික බලපෑම් අවම කිරීමට ශ්‍රී ලංකාවේ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව අපද්‍රව්‍ය භූමියකට අවසාන වශයෙන් බැහැර කරලීම අදහස් කෙරේ.

''හිමිකරු හෝ පදිංචිකරු'' යන්නෙන් පරිශ්‍රයේ හිමිකරු හෝ පදිංචිකරු වෙනුවෙන් ඇටෝනි බලය දරන යම් තැනැත්තෙකු හෝ හිමිකරු විසින් සිය කර්මාන්තය, කර්මාන්ත ශාලාව, වත්ත කළමණාකරණයට පත් කරන ලද නියෝජිතයෙකු හෝ භාරකරුවෙකු හෝ කුලියට ලබාගන්නා අයෙකු ඇතුළත් වන අතර වෙනත් තැනැත්තෙකුගේ නියෝග යටතේ ක්‍රියා කරන කළමනාකරුවෙකු ඇතුලත් වේ.

''මෙම වගන්තියේ කාර්යයන් සඳහා කැනීම, ඉදිකිරීම හා කඩාදැමීම යන ක්‍රියාවක නියුතු සෑම තැනැත්තෙකු'' යන්නට සේවා යෝජකයෙකු විසින් එම සේවය සඳහා නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තෙකුටද ඇතුලත් වේ.

''අපද්‍රව්‍ය'' යන්නට ඉදිකිරීමේදී ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතයෙන් ජනනය වන්නාවූ පස්, මඩ, දූවිලි, හා අපද්‍රව්‍ය සහ යම් ඉදිකිරීමක් කඩාදැමීමේ දී ජනනය වන්නාවූ අපද්‍රව්‍ය ඇතුලත් වේ.

''ආරෝග්‍ය ශාලාව'' යන්නෙන් අදහස් කරන්නේ යම් රෝගයකින් හෝ දුබලතාවයකින් පෙලෙන තැනැත්තන් හෝ සතුන් පිළිගැනීම, ඔවුන්ට සාත්තු කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොදගනු ලබන හෝ යොදගැනීමට අපේක්ෂා කරන යම් පරිශ්‍රයක් (කුමන ආකාරයෙන් විස්තර කරණු ලැබූවද) වන අතර සාත්තු නිවාසයක්, සායනයක්, වෛද්‍ය මධ්‍යස්ථානයක්, මාතෘ නිවාසයක් සහ සත්ව රෝහලක්/සත්ව සායන ඊට ඇතුළත් වේ.

''උපද්‍රවකාරී ආරක්ෂණ අපද්‍රව්‍ය'' යන්නෙන් අදහස් කරන්නේ සායනික අපද්‍රව්‍ය, ශරීර කොටස්, වැදෑ මස්, ආසාදනය වන සුළු හා අතිශයෙන් ආසාදනය වන සුළු අපද්‍රව්‍ය හා උල් කටුය.

''කාර්යාලය'' යන්නට 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාලය සේවා නියුක්තිකයන් පිළිබඳ පනතේ (129 වන අධිකාරිය) දී ඇති අර්ථයම ඇත.

''සාප්පුව'' යන්නෙන් අදහස් කෙරෙන්නේ තොග හෝ සිල්ලර වෙළඳාම සඳහා භාණ්ඩ තබා ඇති ස්ථානයක් වන අතර ආහාර පාන අලෙවියට තබා ඇති ස්ථානයක් සහ බාබර් සාප්පුවක් හෝ රූපලාවන්‍ය සැලෝන් එකක් පවත්වාගෙන යනු ලබන ස්ථානයද මේ සඳහා ඇතුලත් වේ.

මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේ ය.

10 - 468/2

වයඹ පළාතේ පළාත් සභාව

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ, පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් ම විසින් සම්පාදනය කරනු ලැබූ, පහත දැක්වෙන කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඉහත කී වගන්තිය යටතේ මෙසේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරිය) 267 වන වගන්තිය සමග කියවිය යුතු එකී ආඥා පනතේ 129 වගන්තිය සහ 272 වන වගන්තියේ 5 වන උප වගන්තියේ (ආ) ඡේදයෙන් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට මහා නගර සභාවට බලය පැවරී ඇති අතර 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ ප්‍රකාර, මෙම සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන වැළඳ ගැනීම සඳහා වයඹ පළාතේ මහා නගර සභා වලට බලය පැවරී ඇත.

නීතිඥ ජේ. පී. දයාසිරි පද්මකුමාර ජයසේකර,
වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලනය,
මානව සම්පත්, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්, පරිසර සංචාරක,
ආයෝජන සම්බන්ධීකරණ, සමුපකාර සංවර්ධන සහ ආහාර සැපයුම් හා බෙදා හැරීම් අමාත්‍ය.

2014 දෙසැම්බර් මස 04 වැනි දින,
කුරුණෑගල දී ය.

මහා නගර සභා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ

අතුරු ව්‍යවස්ථාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ලෙස සඳහන් කරනු ලැබේ.

02. මහා නගර සභා සීමාවන් ඇතුළත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීථිවල, මංමාවත් වල ජනනය වන ඝණ අපද්‍රව්‍ය වෙන් කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

03. මහා නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙකුම හෝ පදිංචිකරුවකුම තම පරිශ්‍රය අපද්‍රව්‍ය වලින් තොර සෞඛ්‍ය සම්පන්න හා ප්‍රසන්න තත්වයෙන් තබා ගත යුත්තේ ය.

04. මහා නගර සභා ප්‍රදේශයේ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍රය ඇතුලත ජනනය වන්නාවූ අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන් කිරීම, ගබඩා කිරීම හා බැහැර කිරීම කළ යුත්තේ ය. නැතිනම් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලව කළ යුත්තේ ය.

05. (i) පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තම පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ ඝණ අපද්‍රව්‍ය අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයක් භාවිතා කරමින් හෝ දෛනිකව නැතිනම් ඊට වඩා අඩු කාලාන්තරයෙන් එක්රැස් කළ යුත්තේ ය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වගාමී උප වගන්තිය අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය අංක 8 සිට 20 දක්වා වන උපවගන්තිවල විධිවිධාන වලට අනුකූලව වෙන් කළ යුත්තේ ය. නැතිනම් එසේ කිරීමට සැලැස්විය යුත්තේ ය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය ගබඩා කිරීම හෝ මුද හැරීම සඳහා භාවිතා කරනු ලබන යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් බහාලුමක් මෙම අතුරු ව්‍යවස්ථාවේ වගන්තිවල කාර්යයන් සඳහා මනා තත්වයන්ගෙන් පවත්වා ගත යුතු වේ.

(iv) මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත 5(I) උප වගන්තියට අනුකූලව එක්රැස් වන කසල භාර ගැනීම සඳහා මහා නගර සභාව විසින් පූර්ව දැනුම් දීමකින් අනතුරුව නිශ්චිත සේවාවක් පවත්වාගෙන යා යුතු අතර එකී (1) වන උප වගන්තියේම සඳහන් ආකාරයට එක්රැස් කරන ලද අපද්‍රව්‍ය මහා නගර සභාව විසින් කලින් කළට තීරණය කර ප්‍රසිද්ධ කරනු ලැබූ මහා නගර සභා බල ප්‍රදේශ තුළ ක්‍රියාත්මක වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ ක්‍රමයට හා කාලසටහනට අනුකූලව හිමිකරු හෝ පදිංචිකරු විසින් භාර දීම කළ යුත්තේ ය.

(v) හිමිකරු හෝ පදිංචිකරු නිවැසියන්ගේ, අමුත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ සෞඛ්‍යයට හෝ එම ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්වයට හානිකර හෝ අන්තරාකාරී වන අන්දමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැර කිරීම නොකළ යුත්තේ ය.

06. (i) කිසිම තැනැත්තෙක් වීථියකට, පාරකට, මංමාවතකට, පටු මාවතකට, මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජල මාර්ගයකට, රක්ෂිතයකට හෝ ජලාශයකට, කළපුවකට, ජල මූලාශ්‍රයකට හෝ මුහුදට අපද්‍රව්‍ය මුදහැරීම නොකළ යුත්තේ ය.

(ii) කිසියම් තැනැත්තෙක් මහා නගර සභා ප්‍රදේශය තුළ විවෘත භූමියක පරිසරයට හානිකර වන අන්දමින් අපද්‍රව්‍ය පිළිස්සීම නොකළ යුත්තේ ය.

(iii) යම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙකු අංක 7 දරන වගන්තියේ විධිවිධාන ප්‍රකාර යම් අපද්‍රව්‍ය වර්ගයක් මුදහැරීම, පිරියම් කිරීම, සැකසීම හෝ බැහැරලීම සඳහා අවසර ලබා ගැනීමට සිදුවන අවස්ථාවකදී එසේ අවසර ගැනීමට අපොහොසත් වේ නම් ඔහුට එම අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) අංක 7 දරන වගන්තියේ විධිවිධාන යටතේ සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම හෝ නොකරනු ලැබූ අපද්‍රව්‍ය ඉහත 6 (iii) හි විධිවිධාන යටතේ යම් බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් කරන ලද යම් අපද්‍රව්‍ය වර්ගයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ වගන්තිවල විධිවිධානවලට අනුකූලව ඉවත් කරනු ලැබිය යුත්තේ ය.

07. (i) යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් හැර අපද්‍රව්‍ය එම පරිශ්‍රය ඇතුළත ම බැහැර කළ හැකිය.

(අ) මහා නගර සභාව විසින් එවැනි අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කර ඇති ප්‍රදේශයන් හි.
(ආ) මහා නගර සභාව විසින් නිශ්චිතව නියම කරනු ලැබ ඇති ඇතැම් අපද්‍රව්‍ය වර්ග

(ii) පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද සැලසුමකට හා ප්‍රමිතියට අනුකූලව ඉදිකරනු ලැබූ දහනයක හෝ පෝරණුවක අපද්‍රව්‍ය පිළිස්සිය හැකිය. නැතිනම් කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද ආකාරයට අපද්‍රව්‍ය පිරියම් කිරීම, සැකසීම හෝ වැළලීම කළ හැකිය.

(iii) යම් හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු ''කොම්පෝස්ට් බඳුන්'' සඳහා කොමසාරිස්වරයා වෙතින් ඉල්ලීමක් කළහොත් ඒ හිමිකරුට හෝ පදිංචිකරුට එම කොම්පෝස්ට් බඳුන් නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් පරිශ්‍රය තුළ තිබේ නම් කොමසාරිස්වරයා එම කොම්පෝස්ට් බඳුන්වල පිරිවැයෙන් කොටසක් හෝ මුළුමනින් හෝ සහනාධාරයක් වශයෙන් ලබාදෙමින් එම කොම්පෝස්ට් බඳුන් හිමිකරුට හෝ පදිංචිකරුට සැපයිය හැකිය.

(iv) හිමිකරු හෝ පදිංචිකරු පරිශ්‍රය ඇතුළත එකතුවන 'ගෙවතු අපද්‍රව්‍ය' හැකිතාක් අදාළ පරිශ්‍රය තුළ මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලව බැහැර කිරීමට කටයුතු කළ යුතුය. අනතුරුව ඉතිරිවන යම් ගෙවතු අපද්‍රව්‍යයක් වේ නම් එය බැහැරලීමට ඇති අපද්‍රව්‍ය වල ස්වභාවය සැලකිල්ලට ගෙන මහා නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි නියමිත ගාස්තුවක් ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට භාරදිය යුත්තේ ය.

(v) වීථියක හෝ මංමාවතක යාබදව පිහිටි යම් ගසක් හෝ ගසක කොටසක් කපන යම් තැනැත්තෙක් වහාම එය ඉවත් කළ යුත්තේ ය. නැතිනම් ඉවත් කිරීමට සැලැස්විය යුත්තේ ය. එසේත් නැතිනම් මහා නගර සභාව විසින් තීරණය කරනු ලබන ගාස්තු ගෙවීමක් මත මහා නගර සභාව වෙනුවෙන් කසල එක්රැස් කරනු ලබන අයට භාර දිය යුත්තේ ය.

(vi) සෑම තැනැත්තෙක්ම ඔහුගේ පාලනය යටතේ සිටින යම් සතෙකු වීථියක, මංමාවතක හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුත්තේය. එසේ මළපහ කරනු ලැබුවහොත් මෙම අතුරු ව්‍යවස්ථාවට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම ඒ තැනැත්තාගේ වගකීම වන්නේ ය.

(vii) කිසිම තැනැත්තෙක් මහා නගර සභා ප්‍රදේශය තුළ කුමන වර්ගයක හෝ අපද්‍රව්‍යයක් වාහනයක සිට වීථියකට, මංමාවතකට හෝ පොදු ස්ථානයකට, ඇලකට, දෙළකට, ජල මූලාශ්‍රයකට, රක්ෂිතයකට හෝ කළපුවකට මුදාහැරීම හෝ එහි තැන්පත් කිරීම හෝ නොකළ යුත්තේ ය.

(viii) නිවෙසක් හෝ වෙනත් යම් පරිශ්‍රයක් ඉදි කිරීමට හෝ අළුත් වැඩියා කිරීමට සැලැස්මක් අනුමත කරවා ගැනීමට අයදුම් කරන යම් කෙනෙක් ඔහුගේ පරිශ්‍රයේ ජනනය වන ඝණ අපද්‍රව්‍ය හා මුදා හරිනු ලබන ද්‍රව්‍ය පිරියම් කරනු ලබන හා සකස් කරනු ලබන ආකාරය පිළිබඳ සැළසුම ඔහුගේ අයදුම්පත්‍රයේ ඇතුළත් කළ යුත්තේ ය.

නිවාස පරිශ්‍රයන්

08. (i) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයකින් එකතු කරනු ලැබූ අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රිකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය
(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි
(ඉ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියලි අපද්‍රව්‍ය

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම එසේ තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම මලුවලට, බඳුන්වලට හෝ වෙනත් බහාලුම්වලට දැමීය යුතු අතර, ඒවා ඉවත් කරනු ලබන තෙක් ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයක තැබිය යුත්තේය. ආහාර අපද්‍රව්‍ය හා ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය තෙතමනය කාන්දු නොවන ද්‍රව්‍යයෙන් සාදනු ලැබූ සහ මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුළුවීම වලකමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක තැබිය යුත්තේය. සතුන්ගේ මළකුණු ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය, බැහැරලිය යුතු අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන මහා නගර සභා බල ප්‍රදේශය සඳහා කලින් කලට මහා නගර සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් අය කිරීමෙන් පසුව පමණක් මහා නගර සභාව විසින් අදාළ අපද්‍රව්‍ය භාර ගැනීම සිදු කළ යුතු ය.

(iii) සෑම හිමිකරුවෙකුටම හෝ පදිංචිකරුවෙකුටම 8 (i) උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. නොඑසේ නම් මහා නගර සභාව විසින් එම අපද්‍රව්‍ය එක්රැස් කරන බහාලුමකට බැහැරලීම කළ යුත්තේ ය.

09. (i) කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැගිල්ලක සෑම අයිතිකරුවෙක්ම ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන අයුරු තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රිකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය
(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි
(ඉ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) 9 (i) වන වගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු ඉහත (අ), (ආ) සහ (ඇ) යන අයිතමය යටතේ විස්තර කර ඇති අපද්‍රව්‍ය සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ ප්‍රමිතීන්ට පිරිවිතරයන්ට අනුකූල වූ බහාලුම් සපයාගත යුතු අතර ඒවා පවිත්‍රව හා සනීපාරක්ෂක තත්වයෙන් පවත්වාගත යුතු ය.

(iii) 9 (i) වන උප වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු 9 (ii) වන උප වගන්තියේ විධිවිධාන වලට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවකදී කොමසාරිස්වරයා විසින් දැනුම්දෙනු ලබන දිනයකදී හෝ ඊට පෙර අදාළ බඳුන් හෝ බහාලුම් සපයන ලෙසට හිමිකරුට හෝ පදිංචිකරුට නියම කිරීමට කොමසාරිස්වරයාට බලය ඇත්තේය. කොමසාරිස්වරයාගේ නියමයන් අනුව ක්‍රියා කිරීම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේ ය.

(iv) ගොඩනැගිල්ලේ බිමක හෝ මහලක හිමිකරු හෝ පදිංචිකරු තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාළ බඳුනකට හෝ බහාලුමකට දැමිය යුත්තේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 9(i) වන උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම බලයලත් එක්රැස් කරන්නෙකුගේ කාර්යය වන්නේ ය. එසේ ඉවත් කරනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් මහා නගර සභාව විසින් ඒ

සඳහා විශේෂයෙන් සකස් කර පවත්වාගෙන යනු ලබන ස්ථානයට බැහැර කිරීම හෝ එසේ මහා නගර සභාව වෙනුවෙන් කසල එක්රැස් කරන්නෙකුට භාර දීම කළ යුත්තේ ය.

(vi) ඉහත 9 (i) (ඇ) අයිතමයෙහි සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත (අ), (ආ), (ඇ) සහ (ඉ) යන අයිතමයන් යටතේ මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර නිවාස පරිශ්‍රයේ අයිතිකරු, කුලී නිවැසියා හෝ පදිංචිකරු එම කසළ බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලයලත් කසල එක්රැස් කරන්නෙකුට විය යුතුය.

10. (i) මහා නගර සභාවේ පූර්ව අනුමැතිය ලබාගෙන මුඩුක්කු නිවැසියන්ගේ භාවිතය සඳහා කොමසාරිස්වරයා විසින් අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නොමිලයේ සැපයීම නීත්‍යානුකූල වේ.

(ii) සෑම මුඩුක්කු නිවසකම හිමිකරු හෝ පදිංචිකරු ඔහුගේ වාසස්ථානයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කර ඔහුගේ වාසස්ථානයට ආසන්නවම සපයනු ලබන අනුමත බඳුන්වලට හෝ බහාලුම්වලට දැමිය යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය

(iii) මේ අතුරු ව්‍යවස්ථාවේ 10 (ii) වන උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම පිණිස අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට අවසර දීම කොමසාරිවරයාගේ කාර්යය විය යුත්තේ ය.

සාප්පු සහ කාර්යාල

11. (i) සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ කළමණාකරුවෙක්ම එක් එක් සංකීර්ණයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කල යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය
(ඈ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරනු ලබනතුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේ ය.

(iii) සාප්පුවක හෝ කාර්යාලයක හිමිකරුට හෝ කළමණාකරුට මෙම අතුරු ව්‍යවස්ථාවේ 11 (i) වන උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) මහල් කිහිපයකින් යුක්ත සාප්පු හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හෝ කළමණාකරු කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම සාප්පුවෙන් හෝ කාර්යාලයෙන් තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 11 (iv) වන උප වගන්තියේ විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති සාප්පුවක හෝ කාර්යාලයක යම් හිමිකරුවෙක් තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම බඳුන්වලට හෝ බහාලුම්වලට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ 11 (i) වන උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට සෑම හිමිකරුවෙකුට සහ කළමණාකරුවෙකුට අයිතිවාසිකමක් ඇත.

(vi) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් නොකරන ලද මෙම අතුරු ව්‍යවස්ථාවේ 11 (i) වන උප වගන්තියේ (ඈ) ලෙස සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග මහා නගර සභාව විසින් කලින් කලට තීරණය කර, කරනු ලබන ගාස්තුවක් අය කිරීමෙන් පසු මහා නගර සභාව වෙනුවෙන් කසල එක්රැස් කරන්නෙකු වෙත භාරදීම නීත්‍යානුකූල වන්නේ ය.

(vii) ඉහත 11 (i) හි (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත II (I) හි (අ), (ආ), (ඈ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමග මිශ්‍රවීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර නිවාස පරිශ්‍රයේ අයිතිකරු, කුලී නිවැසියා එම කසළ බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය දී ඇති කසළ එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

(viii) අසල්වාසීන්ට හෝ එකී සාප්පුවේ හෝ කාර්යාලයේ සේවයේ නියුතු තැනැත්තන්ට හෝ යම් සෞඛ්‍ය හෝ සනීපාරක්ෂක ගැටළුවක් ඇති නොවීම පිණිස අපද්‍රව්‍ය ඉවත් කිරීමත් මෙම අතුරු ව්‍යවස්ථාවේ විශේෂයෙන් නියම කර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් සභාව වෙනුවෙන් නඩත්තු කිරීමත් යම් සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙකුගේම හෝ කළමණාකරුවෙකුගේම වගකීම වන්නේ ය.

හෝටල්

12. (i) සෑම හෝටල්කරුවෙක්ම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තම පරිශ්‍රයේ එක්රැස් වන අපද්‍රව්‍ය පහත දක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය. නැතහොත් එසේ කිරීමට සැලැස්විය යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය

(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය

(ඈ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) සෑම හෝටල්කරුවෙක්ම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තෙක් වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iii) සෑම හෝටල්කරුවෙක්ම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතෙකු ඇතුළු වීම වළකමින් සියළුම ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද සහ පියනක් යොදා නිසි ලෙස ආරක්ෂාකාරී කරන ලද බඳුනක හෝ වෙනත් බහාලුමක ඇසිරිය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 12(i) වන උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 12 (iv) වන උප වගන්තිය යටතේ බාර ගනු නොලැබූ ඉහත (අ), (ආ) අයිතම යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍ය මහා නගර සභාව විසින් එවැනි කසළ එක්රැස් කිරීම සඳහා විශේෂිතව සකස් කරන ලද බහාලුමකට හෝ නම් කරන ලද ස්ථානයට බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(vi) ඉහත 12 (i) හි (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත (අ), (ආ), (ඈ) යන අයිතම යටතේ මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකල යුතු අතර සෑම හෝටල් කරුවෙකුම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලයලත් කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

එළවළු සහ පළතුරු වෙළඳසැල්

13. (i) සෑම එළවළු සහ පළතුරු වෙළඳසැලකම හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා තම වෙළඳසැලේ එක්රැස්වන අපද්‍රව්‍ය පහත දක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) මිනිස් පරිභෝජනයට නුසුදුසු එළවළු, පළතුරු හෝ වෙනත් යම් දිරන අපද්‍රව්‍ය

(ආ) ප්‍රතිභාවිතකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 13 (i) වන උප වගන්තියේ (අ) අයිතමයෙහි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යකින් සාදන ලද වෙනම බහාලුමක තැබිය යුතු අතර එය තුළට මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේ ය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු යම් බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 13(i) වන උප වගන්තියේ (අ), (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතුය. එසේ භාරදෙනු නොලැබූ අපද්‍රව්‍යයක් ඉහත (අ), (ආ) අයිතම යටතේ විස්තර කරනු ලැබූ සභාව විසින් පවත්වාගෙන යන කසළ එක්රැස් කරන තැනැත්තෙකුට භාර දීම හෝ ස්ථානයකට බැහැර කිරීම කළ යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 13 වගන්තියේ, (iii) වන උප වගන්තිය යටතේ භාර ගනු නොලැබූ ඉහත (අ), (ආ) අයිතම යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍ය මහා නගර සභාව විසින් එවැනි කසළ එක්රැස් කිරීම සඳහා විශේෂිතව සකස් කරන ලද බහාලුමකට හෝ ස්ථානයකට බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

මස්, මාළු, හෝ බිත්තර වෙළඳ කුටි

14. (i) තත් කාර්යය සඳහා නගරාධිපතිවරයා විසින් ඊට අදාළ යම් ලිඛිත නීතියක් යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ප්‍රකාර එහි සඳහන් ස්ථානයේදී කිසිම තැනැත්තෙක් ගෝඝාතක ආඥා පනතේ විධිවිධාන යටතේ අවසරලත් සතුන් හැරුනුවිට වෙනත් කිසිම සතෙකු ඝාතනය නොකළ යුත්තේ ය.

(ii) මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යාපාරය කරගෙන යන අය ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) මිනිස් පරිභෝජනයට නුසුදුසු සත්ව මළකුණු හෝ මළකුණුවල කොටස් හෝ බිත්තර හෝ වෙනත් දිරන අපද්‍රව්‍ය

(ආ) ප්‍රතිභාවිතකරණීය හා ප්‍රතිචක්‍රිකරණීය අපද්‍රව්‍ය

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම භාජනයක හෝ වෙනත් බහාලුමක් තුළට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ 14 (ii) වන උප වගන්තියේ (අ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන බහාලුමක් ඇතුලත තැබිය යුතු අතර එම බහාලුමට මැස්සන්, මීයන්, කෘමීන් හෝ වෙනත් සතුන් ඇතුලුවීම වලකමින් එය නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 14 (ii) වන වගන්තියේ (අ), (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග අවසර ලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දිය යුතුය. එසේ භාරදෙනු නොලැබූ ඉහත (අ), (ආ) අයිතම යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍යයක් මහා නගර සභාව විසින් පවත්වාගෙන යන කසළ එක්රැස් කරන තැනැත්තෙකුට භාරදීම හෝ ස්ථානයකට බැහැර කිරීම කළ යුත්තේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 14 (iv) වන උප වගන්තිය යටතේ භාර ගනු නොලැබූ ඉහත (අ), (ආ) අයිතම යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍ය මහා නගර සභාව විසින් එවැනි කසළ එක්රැස් කිරීම සඳහා විශේෂිතව සකස් කරන ලද බහාලුමකට හෝ ස්ථානයකට බැහැර කිරීම නීත්‍යානුකුල වන්නේ ය.

පදික වෙළඳාම හෝ සංචාරක වෙළඳාම

15. (i) අපද්‍රව්‍ය ජනනය වන්නාවූ ව්‍යාපාරයක් පවත්වාගෙන යන සෑම සංචාරක හෝ පදික වෙළෙන්දෙක්ම, ඊට අදාලව යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ විධිවිධාන සලසා ඇති පරිදි හා ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක් තබාගත යුත්තේ ය. එවැනි කිසිම අපද්‍රව්‍යයක් පදික වේදිකාවේ, මහා මාර්ගයේ ජල කානුවකට හෝ පොදු ස්ථානයකට නොදැමිය යුත්තේ ය.

(ii) සෑම පදික හෝ සංචාරක වෙළෙන්දෙක්ම වාහනවල හෝ පදිකයින්ගේ ගමනාගමනයට බාධා ඇති වන ආකාරයෙන් බඳුනක් හෝ වෙනත් බහාලුමක් නොතැබිය යුත්තේ ය.

(iii) සෑම පදික හෝ සංචාරක වෙළෙන්දෙක්ම ඔහුගේ ව්‍යාපාරය හේතුවෙන් ජනනය වන්නාවූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය සහ වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය

(ආ) ප්‍රතිභාවිතකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය

(iv) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම බඳුනක් හෝ වෙනත් බහාලුමක් තුළට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ 15 (iii) උප වගන්තියේ (අ) අයිතමයේ සඳහන් කර ඇත්තා වූ අපද්‍රව්‍ය කෘමීන්, මීයන් හෝ වෙනත් සතුන් විසින් කා දැමීමට නොහැකි වන පරිදි ආරක්ෂාකාරී බහාලුමක අභ්‍යන්තරයේ තැබිය යුතු අතර අමතර අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය වන විට හැර එය වසා තැබිය යුත්තේ ය.

(v) සෑම පදික හෝ සංචාරක වෙළෙන්දෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ 15 (iii) උප වගන්තියේ (අ) හා (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍යය එක්රැස් කරන්නෙකුට භාර දිය යුතුය.

(vi) ඉහත 15 (iii) (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත 15 (III) (අ), (ආ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමග මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකල යුතු අතර පදික වෙළෙන්ද හෝ සංචාරක වෙළෙන්ද එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය ලබා දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතුය.

(vii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 15 (v) වන උප වගන්තිය යටතේ භාරගනු නොලැබූ ඉහත 15 (III) (අ), (ආ) අයිතම යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍ය මහා නගර සභාව විසින් එවැනි කසල එක්රැස් කිරීම සඳහා විශේෂිතව තබන ලද බහාලුමකට හෝ ස්ථානයකට බැහැර කිරීම නීත්‍යානුකුල වන්නේ ය. මෙම සෑම සංචාරක/පදික වෙළෙන්දෙක්ම අපද්‍රව්‍ය බඳුන් නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දීමට පෙර මහා නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවිය යුත්තේ ය.

කර්මාන්තශාලා

16. (i) සෑම කර්මාන්තශාලා හිමිකරුවෙක්ම හෝ නිෂ්පාදකයෙක්ම කර්මාන්තශාලා පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කර පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය
(ඈ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 16 (1) උප වගන්තියේ (අ), (ආ) හා (ඈ) යන අයිතමවල විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය මහා නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීම මත මහා නගර සභාවේ කසළ එක්රැස් කරන්නෙකුට භාර දීම කළ යුත්තේ ය.

(iii) වයඹ පළාතේ 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසි වලට අනුකූලව උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉවත් කළ යුතු වන්නේ ය.

(iv) ඉහත 16 (i) (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍යය ඉහත (අ), (ආ) (ඈ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමග මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකල යුතු අතර කර්මාන්ත ශාලා හිමිකරු හෝ ඔහු විසින් බලය දී ඇති තැනැත්තා එම කසළ බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය ලබා දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

කැනීම්, ඉදිකිරීම් සහ කඩා දැමීම

17. (i) යම් වීථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කනින හෝ යම් නිර්මාණයක් ඉදිකරන හෝ කඩාදමන සෑම තැනැත්තෙක්ම එමගින් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය සුදුසු ආකාරයකින් එකී පරිශ්‍රයෙන් ඉවත් කරන තෙක් පරිශ්‍රය ඇතුළත හෝ කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලබන ස්ථානයක හෝ ගබඩා කළ යුත්තේ ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 17 (i) වන උප වගන්තියේ සඳහන් වන අපද්‍රව්‍ය මහා නගර සභාව විසින් කලින් කළට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් කොමසාරිස්වරයාට ගෙවීම මත මහා නගර සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

ආරෝග්‍යශාලා

18. (i) ආරෝග්‍යශාලාවක භාරකරු පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) සායනික අපද්‍රව්‍ය
(ඈ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය
(ඉ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) 18 (i) වන උප වගන්ති යටතේ (අ) සහ (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුතු අතර, එකී අපද්‍රව්‍ය මහා නගර සභාව විසින් ඒ සඳහා විශේෂයෙන් සලසා ඇති වැඩපිළිවෙලක් යටතේ කසල එක්රැස් කරනු ලබන අවස්ථාවක මහා නගර සභාව වෙනුවෙන් එසේ කසල එක්රැස් කරන්නා වෙත භාර දිය යුතුය. 18 (i) වගන්තියේ (ඉ) අයිතමය යටතේ දක්වා ඇති කසල මහා නගර සභාව විසින් කලින් කළ තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසු ඒ සඳහා විශේෂිත කසල එක් රැස් කරනු ලබන ආකාරයට මහානගර සභාව වෙනුවෙන් කසල එක්රැස් කරන්නා වෙත භාර දිය යුතුය.

(iii) 18 (i) උපවගන්තියේ (ඇ) සහ (ඈ) අයිතම යටතේ එකතුවන අපද්‍රව්‍ය කවර ආකාරයකින් හෝ වෙනත් අපද්‍රව්‍ය සමග මිශ්‍ර නොකල යුතු අතර එකී අපද්‍රව්‍ය වයඹ පළාතේ 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසි වලට අනුකූලව බැහැර කළ යුත්තේ ය.

පෞද්ගලික රෝහල් හා රසායනාගාර

19. (i) පෞද්ගලික රෝහලක හෝ රසායනාගාරයක හිමිකරු හෝ අයිතිකරු තම ආයතනය තුළ ජනනය වන්නාවූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) සායනික අපද්‍රව්‍ය
(ඈ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය
(ඉ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) 19 (i) වන උප වගන්තිය යටතේ (අ) සහ (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම් වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුතු අතර එකී අපද්‍රව්‍ය මහා නගර සභාව විසින් ඒ සඳහා විශේෂයෙන් සලසා ඇති වැඩ පිළිවෙළක් යටතේ කසල එක්රැස් කරන අවස්ථාවක මහා නගර සභාව වෙනුවෙන් එසේ කසල එක්රැස් කරන්නා වෙත භාර දිය යුතු ය.

(iii) 19 (i) උප වගන්තියේ (ඉ) අයිතමය යටතේ සඳහන් කර ඇති අපද්‍රව්‍ය මහා නගර සභාව විසින් කලින් කළ තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසු එක්රැස් කරන්නා වෙත භාරදිය යුතුය.

(iv) ඉහත 19 (i) උප වගන්තියේ (ඇ), (ඈ) අයිතමය යටතේ එකතුවන අපද්‍රව්‍ය කවර ආකාරයකින් හෝ වෙනත් අපද්‍රව්‍ය සමග මිශ්‍ර නොකළ යුතු අතර එකී අපද්‍රව්‍ය 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්ති යටතේ නිකුත් කරනු ලැබූ පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසි වලට අනුකූලව බැහැර කළ යුත්තේ ය.

වෙනත් පරිශ්‍රයන්

20. (i) අංක 8 සිට 19 දක්වා වන වගන්තියන් හි විශේෂයෙන් සඳහන් කර නොමැති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙක් හෝ මහජනතාවගේ සහභාගිත්වය ඇතිව පොදු, ආගමික, සාමාජීය, සංස්කෘතික හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධානය කරන හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක් එකී ක්‍රියාකාරකම් නිසා හෝ එවැනි ආයතනයක් පවත්වාගෙන යාම නිසා ජනනය වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය

(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය

(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය

(ඈ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය

(ii) 20 (i) වන උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන පුද්ගලයෙක් එම ක්‍රියාකාරකම නිසා ජනනය වන්නාවූ අපද්‍රව්‍ය එක්රැස් කිරීමට විශේෂ වැඩපිළිවෙලක් යෙදීමට හැකිවනු පිණිස ඒ ගැන කල්තියා මහා නගර සභාවට දැනුම්දිය යුත්තේ ය.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරගනු ලබන තෙක් වෙනම බහාලුම්වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 20 (i) වන උපවගන්තියේ (අ), (ආ) හා (ඇ) යන අයිතම යටතේ එක්රැස් වන අපද්‍රව්‍ය මහා නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබූ පරිදි ප්‍රකාශයට පත් කර ඇති ගාස්තුවක් අය කර මහා නගර සභාව විසින් බලය දී ඇති කසල එක්රැස් කරන්නෙකු විසින් භාර ගැනීම නිත්‍යානුකූල වන්නේ ය.

(v) එසේ වුවද කිසියම් ආගමික ස්ථානයක ආගමික කාර්යයක් වශයෙන් වානිජ පරමාර්ථයකින් තොරව පවත්වාගෙන යනු ලබන කවර ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් වුවද එකී ක්‍රියාකාරකම හේතුවෙන් එක්රැස් වන ඉහත (i) උප වගන්තියේ (අ), (ආ) සහ (ඇ) යන අයිතමයන් යටතේ එක්රැස්කරනු ලබන අපද්‍රව්‍ය බැහැර කරලීම සම්බන්ධයෙන් ඉහත (iv) උප වගන්තියේ සඳහන් මහනගර සභාව විසින් කලින් කළ තීරණය කරනු ලබන ගාස්තුවක් අය කිරීම යන්න අදාළ නොවේ.

(vi) ඉහත 20 (i) (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත 20 (i) (අ). (ආ) සහ (ඈ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමග මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර නිවාස පරිශ්‍රයේ අයිතිකරු කුලී නිවැසියා හෝ පදිංචිකරු එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලයලත් කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

වීථි සහ පොදු ස්ථාන

21. (i) මහා නගර සභාව විසින් තීරණය කරන ආකාරයට නගරාධිපතිවරයා විසින් පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුත්තේ ය.

(අ) මහා නගර සභා ප්‍රදේශය තුළ පිහිටි වීථි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළඳ පොළවල් පිරිසිදු හා සනීපාරක්ෂක තත්වයෙන් පවත්වා ගැනීම.

(ආ) මහා නගර සභා බල ප්‍රදේශයේ කසල තාවකාලිකව එක්රැස් කිරීමට යථායෝග්‍යයැයි හඳුනාගන්නා ස්ථානයන්හි ප්‍රමාණවත් බක්කි සංඛ්‍යාවක් සවි කිරීම හා නඩත්තු කිරීම.

(ඇ) උත්සවවලදී, විශේෂ සිදුවීම් අවස්ථාවලදී හෝ මහා නගර සභාව විසින් තීරණය කරනු ලබන සිදුවීම් අවස්ථාවල දී මහා නගර සභාවෙන් තීරණයක් කරන විටකදී හෝ එකී උත්සව හෝ විශේෂ සිදුවීම් අවස්ථා සංවිධායකවරුන්ගේ ඉල්ලීමක් මත හෝ පොදු ස්ථානයන්හි භාවිතය සඳහා ජංගම අපද්‍රව්‍ය බක්කි සැපයීම

(ඈ) කසල තාවකාලික එක්රැස් කිරීමට යථායෝග්‍ය යැයි හඳුනාගෙන ඇති ස්ථානවල සවි කර ඇති පොදු අපද්‍රව්‍ය බක්කි හෝ බහාලුම් සනීපාරක්ෂක තත්වයෙන් පවත්වා ගැනීම සහ ඒ ආසන්නයේ පදිංචි වැසියන්ට එය පීඩාවක් වීමට පෙර එම බක්කිවල හා බහාලුම්වල තැන්පත් කර ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම.

(ඉ) පූර්වගාමී වගන්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශනය කිරීම හා අප්‍රමාදව ඒ ගැන ක්‍රියා කිරීම.

(ii) මහා නගර සභාව විසින් විශේෂයෙන්ම එක් එක් අපද්‍රව්‍ය සඳහා වෙන් කරනු ලැබූ බක්කියක ඊට අදාළ නොවන අපද්‍රව්‍ය තැන්පත් කිරීම කිසිම තැනැත්තෙක් නොකළ යුත්තේ ය.

මහා නගර සභාවේ යුතුකම්

22. (i) කොමසාරිස්වරයා විසින් නගරාධිපතිවරයා සමග සාකච්ඡා කර මහා නගර සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ හැක්කේ ය.

(අ) අපද්‍රව්‍ය අඩු කිරීමට, ප්‍රතිචක්‍රීකරණයට ජනතාව ධෛර්යමත් කිරීම.

(ආ) අපද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, එක්රැස් කිරීම, ගබඩා කිරීම, මුදාහැරීම හා බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මඟින් ප්‍රචාරණය කිරීම.

(ඇ) ප්‍රතිභාවිතාකරණ හා ප්‍රතිචක්‍රීකරණ කටයුතුවල නියුක්ත පුද්ගලයින්ට හා කුඩා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම.

(ඈ) අපද්‍රව්‍ය අඩු කිරීමේ, ප්‍රතිභාවිතා කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම් වලට සම්බන්ධ වී සිටින අයට දිරි ගැන්වීම් පිරිනැමීම.

(ඉ) අපද්‍රව්‍ය මුදාහැරීමේ ක්‍රම පිළිබඳ වෙනස් ආකෘති නියාමනය කිරීම.

(ඊ) මහා නගර සභා බල ප්‍රදේශයේ එක් එක් ප්‍රදේශයන්හි එක් එක් අපද්‍රව්‍ය වර්ග සඳහා මහා නගර සභාව විසින් තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්කාසු කරන දිනයන්, වේලාවන්, ක්‍රමවේදයන් හා ගාස්තු සඳහන් කරමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ කාල සටහනක් පිළියෙළ කිරීම සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන් හි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා වන කොන්දේසි එම කාල සටහනට ඇතුළත් කිරීම.

(උ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට වෙනම භාරදෙනු නොලැබූ යම් වෙන් කරන ලද අපද්‍රව්‍යයක කාල සටහනට අනුව නියමිත වේලාවට එක්රැස් කිරීම.

(ඌ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදෙනු නොලැබූ අන්තරායකාරී අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහනය කිරීම.

(එ) අන්තරායකාරී අපද්‍රව්‍ය හෝ කොමසාරිස්වරයා විසින් නියම කරන ලද වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර වීථි අතුගෑමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් සහා පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය පොදු බක්කිවලින් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය සහ මහා නගර සභාවේ කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දීම හෝ මහා නගර සභාව විසින් විධිමත් පරිදි බැහැර කිරීමට කටයුතු කිරීම.

(ඒ) ආහාර සහ වෙනත් ජෛව ජීරණනීය ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය ප්‍රායෝගිකව කළ හැකි තාක් මුළුමනින්ම හෝ කොටසක් හෝ සැකසීමට හා පිරියම් කිරීමට වැඩ පිළිවෙලක්ද ඇතුළත්ව මහා නගර සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නන් විසින් එක්රැස් කරනු ලබන වෙන් කරන ලද අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ එම ක්‍රියාවලියෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ගවල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය කොමසාරිස්වරයා අනුමත කරන ආකාරයට බැහැරලීමට යෝග්‍ය පියවර ගැනීම.

(ඔ) වයඹ පළාත් පරිසර අධිකාරිය සමග සියලුම අන්තරායකාරී අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් සියළු කටයුතු නියාමනය කිරීම.

(ඕ) 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියේ විධිවිධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීම සහ එම බල පත්‍රයේ හෝ පරිසර ආරක්ෂණ බල පත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති කොන්දේසිවලට යටත්ව අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂක බිම් පිරවුමක් පවත්වාගෙන යාම හෝ ඒ හා සම්බන්ධ වෙනත් විධිමත් විකල්ප ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.

(ක) අපද්‍රව්‍ය අතුගෑම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම හා බැහැරලීම යන කාර්යයන් හි නිරතවන සෑම සේවකයෙකුටම පිරිසිදුකාරක ද්‍රව්‍ය, සුදුසු ඇඳුම්, අත් ආවරණ, මුඛ ආවරණ සහ බූට් සපත්තු සැපයීම හා එකී සේවකයින් සඳහා සෞඛ්‍ය රක්ෂණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම හා වසරකට දෙවරකට නොවැඩි සෞඛ්‍ය සායනයන් පැවැත්වීම.

(ග) මහා නගර සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.

(ජ) 2000 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ පිළිබඳ ජාතික උපාය මාර්ගය සහ අදාළ නීතියට හා 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියට අනුකූලව සවිස්තර වශයෙන් යටත් පිරිසෙයින් එක් එක් ලිත් වර්ෂයන් ආවරණය කරන හා අවසාන බැහැරලීම සම්බන්ධයෙන් වර්ෂ 03 ක් ඉදිරියට ආවරණය කරන ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම එම සැලැස්ම ආවරනය කරන කාලසීමාව අනුව නිරන්තර පදනම මත මහා නගර සභාව විසින් වාර්ෂිකව එය අනුමත කරනු ලැබීම.

(ට) 22 වගන්තියේ (අ) සිට (ජ) දක්වා අයිතමයන්හි සඳහන් වන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලැබෙන යම් පැමිණිල්ලක් එය අදාළ වන්නේ උද්ගත විය හැකි පීඩාවකට නම් දින තුනක් ඇතුලතත් වෙනත් පැමිණිල්ලක් නම් දින දහතරක් ඇතුළතත් විමර්ශණය කිරීම හා වහාම අවශ්‍ය කටයුතු කිරීම.

අවසර පත්‍රය

23. (i) අපද්‍රව්‍ය ප්‍රතිභාවිතයට ගන්නා වූ හා ප්‍රතිචක්‍රීකරණය කරන්නා වූ හෝ කොම්පෝස්ට්, ජීව වායු හෝ වෙනත් නිපැයුම් නිර්මාණය කරන්නා වූ යම් තැනැත්තෙක් හෝ තැනැත්තන් පහත දක්වෙන කරුණු සපුරාලන්නේ නම් ඔහුට මහා නගර සභාව විසින් අවසරපත්‍රයක් නිකුත් කරනු ඇත.

(අ) මහා නගර සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා ප්‍රකාර මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත හෝ වෙනත් පළාත් පාලන ආයතන ප්‍රදේශයක හෝ යම් ව්‍යාපාරයක් කරගෙන යාම.

(ආ) 1990 අංක 12 දරන වයඹ පළාත් පරිසර ප්‍රඥප්තිය යටතේ විධිවිධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම.

(ඇ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා මහා නගර සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතින්ට අනුකූලව ඉදිකරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන තිබීම.

(ඈ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලබන පරිදි හා ජනතාවට පීඩාවක් සිදු නොවන සනීපාරක්ෂක ක්‍රමයකට ප්‍රවාහනය කිරීම සඳහා වාහන තිබීම.

(ඉ) අදාළ ව්‍යාපාරය මහා නගර සභාවේ සීමාවක් ඇතුළත කරගෙන යනු ලබන විටෙක දී මහා නගර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා ගාස්තුවක් මහා නගර සභාවට ගෙවීම මත අපද්‍රව්‍ය සැකසීමේදී හෝ පිරියම් කිරීමේදී අවශේෂ වන්නාවූ හෝ ප්‍රතික්ෂේප වන්නා වූ හෝ අතුරු නිෂ්පාදන වශයෙන් නිර්මාණය කෙරෙන්නාවූ අපද්‍රව්‍ය මහා නගර සභාව විසින් අනුමත කරනු ලබන පරිදි මහා නගර සභාවට භාර දීමට එකඟ වීම.

(ii) මහා නගර සභාව අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ විටෙක හෝ නිෂ්ප්‍රභා කළ විටෙක ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත් එසේ ප්‍රතික්ෂේප කිරීමට හා නිෂ්ප්‍රභා කිරීමට හේතු අවසර පත්‍රය සඳහා ඉල්ලුම් පත්‍රය ලැබී දින 30 ක් ඇතුළත ලිඛිතව ඉල්ලුම්කරුට දැනුම් දිය යුත්තේ ය.

(iii) කොමසාරිස්වරයා විසින්, වලංගු කාල පරිච්ඡේදය තුළ එක් රැස් කිරීමට අවසර දෙනු ලබන අපද්‍රව්‍ය වර්ගය හෝ වර්ග එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසර දෙනු ලබන ප්‍රදේශය සහ වෙනත් සුදුසු කොන්දේසි අවසර පත්‍රයේ දක්විය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 23 (i) වන උප වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා නොකරන අවස්ථාවකදී මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය අවලංගු කළ යුත්තේ ය.

(v) 23 (iv) වන උප වගන්තියේ විධිවිධාන යටතේ අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවකදී කිසිම තැනැත්තෙක් අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ ලබාගැනීම හෝ නොකළ යුත්තේ ය. එවැනි අවස්ථාවකදී අවසර පත්‍රය අවලංගු කරනු ලැබූ බවට ජනතාව දැනුවත් කිරීම පිණිස කොමසාරිස්වරයා මාධ්‍ය මගින් හෝ වෙනත් ක්‍රමයකින් ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදිය යුත්තේ ය.

අපද්‍රව්‍ය බැහැරලන ප්‍රදේශ

24. මහා නගර සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීමේ කාර්යයන් සඳහා වෙන් කරන ලද ප්‍රදේශ වලට අවසර නොලත් තැනැත්තෙක් ඇතුළු නොවිය යුතු හා එහි නොගැවසිය යුතු අතර, එම ප්‍රදේශයේ යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඉවතලන දෙයක් තැන්පත් කිරීම, අවුල් කිරීම, හෝ ඉවත් කිරීම නොකළ යුත්තේ ය. කිසිම තැනැත්තෙක් විශේෂයෙන් නියම කරනු ලබන කොන්දේසි වලට යටත්ව මහා නගර සභාව විසින් අවසර දෙනු ලැබුවහොත් මිස මහා නගර සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි යම් තහනම් කරන ලද අපද්‍රව්‍ය තැන්පත් නොකළ යුත්තේ ය.

25. අනුමත කිරීමේ යම් කොන්දේසිවලට යටත්ව කොමසාරිස්වරයාගේ සහ වයඹ පළාත් පරිසර අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව මිස කිසිම තැනැත්තෙක් මහා නගර සභා සීමාවන් ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ පහසුකමක් එයට පිටස්තර ස්ථානයක ජනනය වන්නාවූ අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා සැපයීම හෝ භාවිතා කිරීම නොකළ යුත්තේ ය.

26. අපද්‍රව්‍ය බැහැර කරනු ලබන කවර ස්ථානයන් වුවද එකී ස්ථානයට නැතහොත් ඉඩමට මායිම් වන සීමාව තාප්පයක් හෝ ඒ සඳහා සුදුසු ආවරණයක් මගින් සීමා කර තිබිය යුතු අතර එකී ස්ථානයට හෝ ඉඩමට බැහැර වන කැලිකසල සුළඟ, ජලය වැනි කාරණා හේතු කොටගෙන යාබද ඉඩම් හෝ ප්‍රදේශ වෙත යොමු වීමට නොහැකි වන ආකාරයට පවත්වාගෙන යායුතු ය.

වෙනත්

27. (i) නගරාධිපතිවරයා හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට සියළු සාධාරණ වේලාවන්හීදී යම් පරිශ්‍රයකට ඇතුළත් වීමට සහ එහි හිමිකරු හෝ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන්නේ දැයි පරීක්ෂා කර බැලීමට බලය ඇත්තේ ය.

(ii) එම පරිශ්‍රයේ හිමිකරු, පදිංචිකරු, භාරකරු, කළමණාකරු හෝ එහි වාසය කරන්නාවූ හෝ සේවය කරන්නාවූ යම් තැනැත්තෙක් නගරාධිපතිවරයාට හෝ ඔහුගේ යම් බලයලත් නිලධාරියෙකුට අවශ්‍ය කරන තොරතුරු ඉදිරිපත් කළ යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නගරාධිතිවරයා ඔහුගේ බලයලත් නිලධාරියෙකුට සිය බලතල භාවිතා කිරීමෙහිලා කිසිම තැනැත්තෙක් බාධා නොකළ යුත්තේ ය.

දණ්ඩන

28. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කවර හෝ වගන්තියක් උල්ලංඝනය කිරීම වරදකරු වන අතර එම වරද සම්බන්ධයෙන් බලය ලත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු මහා නගර සභා ආඥාපනතේ 252 අධිකාරිය යටතේ සඳහන් දණ්ඩන සීමාවන් යටතේ දඬුවම් ලැබිය යුතු යි.

අර්ථ නිරූපණය

29. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

"අපද්‍රව්‍ය හෝ ඝන අපද්‍රව්‍ය" යන්නෙන් ඒවා ඉවත දැමූ තැනැත්තාට පරිභෝජන වටිනාකමක් නොමැති ද්‍රව්‍ය අදහස් වන අතර රොඩු, කසළ, විවී ශුද්ධ කිරීමේ එකතුවන ද්‍රව්‍ය, දූවිලි, පස්, මඩ සහ අළු ද අදහස් කෙරේ.

"ආහාර අපද්‍රව්‍ය" යන්නෙන් මිනිස් පරිභෝජනය සඳහා පාවිච්චියට ගත නොහැකි ආහාර ද්‍රව්‍ය අදහස් කෙරේ.

"උපද්‍රවකාරී අපද්‍රව්‍ය" යන්නෙන් මහජන සෞඛ්‍යයට හෝ පරිසරයට හානිදායක වන විෂ සහිත, දැවෙන සුළු, ප්‍රතික්‍රියා දක්වන සුළු, රෝග කාරක, විකිරණශීලි ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

"එක් රැස් කිරීම" යන්නෙන් බලයලත් එක්රැස් කරන්නෙකු හෝ මහා නගර සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් ප්‍රතිචක්‍රීකරණය, සැකසීම, පිරියම් කිරීම.

"කොම්පෝස්ට්" යන්නෙන් කාබනික අපද්‍රව්‍ය ක්ෂුද්‍රජීවී ජීර්නයට ලක්වීමෙන් පසුව ලැබෙන අවසන් නිමැවුම අදහස් කෙරේ. එය පාංශු තත්වාරක්ෂකයක් ලෙස ක්‍රියාකල හැකි හියුමස් ද්‍රව්‍යයකි.

නගරාධිතිවරයා :- මහා නගර සභාව සඳහා තේරීපත්වී ඇති නගරාධිපතිවරයා ය

"කොමසාරිස්වරයා" යන්නෙන් මහා නගර සභා බල ප්‍රදේශයේ සම්බන්ධයෙන් වන විට මහා නගර සභා ආඥාපනත යටතේ එම මහා නගර සභා බල ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද මහා නගර සභාවේ කොමසාරිස්වරයා අදහස් කෙරෙන අතර එම මහා නගර සභාවේ කොමසාරිස්වරයා වෙනුවෙන් වැඩ බැලීමට පත් කරන ලද යම් තැනැත්තෙකු සහ මහා නගර සභා ආඥපනත යටතේ කොමසාරිස්වරයාගේ බලතල යුතුකම් හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට බලය දෙනු ලැබූ එකී මහා නගර සභාවේ යම් නිලධාරියෙකු එම නිලධාරියාට එම බලය දෙනු ලැබ ඇති ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"ගබඩා කිරීම" යන්නෙන් හිමිකරුවකුගේ හෝ පදිංචිකරුවකුගේ පරිශ්‍රය ඇතුළත හෝ අනුමත පොදු එක්රැස් කිරීමේ ස්ථානයක අපද්‍රව්‍ය තැබීම හෝ තැන්පත් කිරීම අදහස් කෙරේ.

"ගාස්තුව" යන්නෙන් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන කිසියම් ගාස්තුවක් අදහස් කෙරේ.

"ගෙවතු අපද්‍රව්‍ය" යන්නෙන් ගෙවත්තක පිහිටි ගස්වලින් හෝ පැළවලින් ඉවත් කෙරෙන ශාඛ කොටස් සහ ගෙවත්තකින් ඉවත් කරනු ලබන ගල්, පස් ආදිය අදහස් කෙරේ.

"ජෛව ජීර්ණනිය අපද්‍රව්‍ය" යන්නෙන් ක්ෂුද්‍ර ජීවී කාරකයන් මගින් දිරාපත් කරනු ලැබීය හැකි. අපද්‍රව්‍ය අදහස් කෙරේ.

"පොදු ස්ථානය" යන්නෙන් පාරක්, පිට්ටනියක්, පොදු ඉඩමක්, මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිටියක්, පොදුගොඩනැගිල්ලක්, සුසානභූමියක්, බස්නැවතුම්පළක්, දුම්රිය ස්ථානයක්, ගඟක්, ඇළක්, දෙළක්, විලක්, ජලාශයක්, පොකුණක්, තටාකයක්, කලපුවක්, අතු ගඟක්, ජල මාර්ගයක්, මුහුදු, මුහුදු වෙරළ හෝ මහජනතාව විසින් පොදුවේ පාවිච්චි කරනු ලබන වෙනත් ස්ථානයක් අදහස් කෙරේ.

"ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය" යන්නෙන් අපද්‍රව්‍ය තවදුරටත් අපද්‍රව්‍ය වශයෙන් හඳුනාගත නොහැකි වන පරිදි එහි ස්වරූපය වෙනස් කරමින් නව පාරිභෝජනය නිෂ්පාදනයන් කිරීමට යොදගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය'' යන්නෙන් සේදීමෙන්, විෂබීජ නැසීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් පිරිසිදු කිරීමෙන් පසුව උපයෝගීකර ගත හැකි අප ද්‍රව්‍ය අදහස් කෙරේ.

''ප්‍රවාහනය'' යන්නෙන් මිනිස් සත්ව හෝ යාන්ත්‍රික බලයකින් ක්‍රියා කරන යම් ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයක් යොද ගනිමින් අපද්‍රව්‍ය එක්රැස් කරනු ලබන ස්ථානයේ සිට ඒවා සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම සඳහා ඇති ස්ථානය වෙත ගෙන යාම අදහස් කෙරේ.

''බක්කිය/බඳුන් හෝ වෙනත් බහාලුම්'' යන්නෙන් අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව අපද්‍රව්‍ය ගබඩා කිරීම, මුදහැරීම, එක්රැස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් ආවරණයක් සහිත වූ බක්කියක්, බඳුනක් හෝ උරයක්, මල්ලක් හෝ වෙනත් බහාලුමක් අදහස් කෙරේ.

''බලයලත් එක් රැස් කරන්නා'' යන්නෙන් අපද්‍රව්‍ය එක්රැස් කිරීමට හෝ ලබාගැනීමට කොමසාරිස්වරයාගෙන් අවසර පත්‍රයක් ලබා ගන්නා තැනැත්තෙකු අදහස් කෙරේ.

''බලයලත් නිලධාරි'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වන රාජකාරි ඉටු කිරීමට හෝ කරගෙන යාමට අවස්ථාවෝචිතව නගරාධිපතිවරයා හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකු අදහස් කෙරේ.

''බැහැරලීම'' යන්නෙන් ප්‍රතිභාවිත නොකරන ලද්දවුත්, ප්‍රතිචක්‍රීකරණය නොකරන ලද්දවුත්, සැකසුම් නොකරන ලද්දවුත්, පිරියම් නොකරන ලද්දවුත් සියළුම අපද්‍රව්‍ය ස්ථිරව රැඳවීමට අදහස් කරනු ලබන ඉඩමෙක මතුපිට හෝ ඇතුළත හෝ තැන්පත් කිරීම අදහස් කෙරේ.

''මාරු කරන ස්ථානය'' යන්නෙන් මහා නගර සභාව විසින් මේ කාර්යය සඳහා නියම කරනු ලබන ස්ථානයක් අදහස් කෙරෙන අතර ඒ ස්ථානයෙහි සිට යම් ප්‍රතිචක්‍රීකරණ, සැකසුම් කරන, පිරියම් කරන හෝ බැහැරලීම කරන පහසුකමක් වෙත අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා අපද්‍රව්‍ය වඩා කුඩා ප්‍රමාණයේ වාහනවලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහනවලට මාරුකිරීම එහිදී සිදු කෙරේ.

''තැනැත්තා'' යන්නෙන් සංස්ථාගත හෝ සංස්ථාගත නොවන සමාගමක් හෝ පුද්ගලයින්ගේ සමිතියක් හෝ මඩුල්ලක් හෝ යම් පුද්ගලයෙක්ද අදහස් කෙරේ.

''මහා නගර සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නා'' යන්නෙන් බක්කිවලින් හෝ බහාලුම්වලින් අපද්‍රව්‍ය අතුගා දැමීම, එක්රැස් කිරීම, ලබාගැනීම හෝ ඉවත් කිරීම සඳහා සභාව විසින් යොදවනු ලැබූ සේවකයෙකු හෝ මේ කාර්යයන් ඉටු කිරීමට සභාව සමග කොන්ත්‍රාත්තුවකට ඇතුළු වී සිටින තැනැත්තෙක් අදහස් කෙරේ.

''වෙන් කිරීම'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යොද ඇති ප්‍රභේදයන්ට අනුකූලව අපද්‍රව්‍ය විවිධ වර්ගවලට තෝරා වෙන් කිරීම අදහස් කෙරේ.

''සැකසීම'' යන්නෙන් අපද්‍රව්‍ය ප්‍රයෝජනවත් නිපැයුමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය අදහස් කෙරේ.

''සභාව'' යන්නෙන් 252 අධිකාරිය වූ මහා නගර සභා ආඥපනත යටතේ සංස්ථාපනය කරන ලද මහා නගර සභාව අදහස් කෙරේ.

''මහා නගර සභා බල ප්‍රදේශය'' යන්නෙන් මහා නගර සභා ආඥාපනත (252 අධිකාරිය) බලය යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදේශය අදහස් කෙරේ.

''සනීපාරක්ෂක බිම් පිරවීම'' යන්නෙන් ඒ හා ආශ්‍රිත සමාජයීය, සෞඛ්‍ය සහ පාරිසරික බලපෑම් අවම කිරීමට ශ්‍රී ලංකාවේ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව අපද්‍රව්‍ය භූමියකට අවසාන වශයෙන් බැහැර කරලීම අදහස් කෙරේ.

''හිමිකරු හෝ පදිංචිකරු'' යන්නෙන් පරිශ්‍රයේ හිමිකරු හෝ හිමිකරු වෙනුවෙන් ඇටෝර්නි බලය දරන යම් තැනැත්තෙකු හෝ හිමිකරු විසින් සිය කර්මාන්තය, කර්මාන්ත ශාලාව, වත්ත කළමණාකරණයට පත් කරන ලද නියෝජිතයෙකු හෝ භාරකරුවෙකු හෝ කුලියට ලබාගන්නා අයෙකු ඇතුළත් වන අතර වෙනත් තැනැත්තෙකුගේ නියෝග යටතේ ක්‍රියා කරන කළමනාකරුවෙකු ඇතුලත් වේ.

''මෙම වගන්තියේ කාර්යයන් සඳහා කැනීම, ඉදිකිරීම හා කඩාදැමීම යන ක්‍රියාවක නියුතු සෑම තැනැත්තෙකු'' යන්නට සේවා යෝජකයෙකු විසින් එම සේවය සඳහා නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තෙකු ද ඇතුලත් වේ.

''ඉදිකිරීම් අපද්‍රව්‍ය'' යන්නට ඉදිකිරීමේදී ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතයෙන් ජනනය වන්නාවූ පස්, මඩ, දූවිලි, හා අපද්‍රව්‍ය සහ යම් ඉදිකිරීමක් කඩාදැමීමේ දී ජනනය වන්නාවූ අපද්‍රව්‍ය ඇතුලත් වේ.

''ආරෝග්‍ය ශාලාව'' යන්නෙන් අදහස් කරන්නේ යම් රෝගයකින් හෝ දුබලතාවයකින් පෙලෙන තැනැත්තන් හෝ සතුන් පිළිගැනීම, ඔවුන්ට සාත්තු කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොදගනු ලබන හෝ යොදගැනීමට අපේක්ෂා කරන යම් පරිශ්‍රයක් (කුමන ආකාරයෙන් විස්තර කරනු ලැබූවද) වන අතර සාත්තු නිවාසයක්, සායනයක්, වෛද්‍ය මධ්‍යස්ථානයක්, මාතෘ නිවාසයක් සහ සත්ව රෝහලක්/සත්ව සායන ඊට ඇතුළත් වේ.

''උපද්‍රවකාරී ආරක්ෂණ අපද්‍රව්‍ය'' යන්නෙන් අදහස් කරන්නේ සායනික අපද්‍රව්‍ය, ශරීර කොටස්, වැදෑ මස්, ආසාදනය වන සුළු හා අතිශයෙන් ආසාදනය වන සුළු අපද්‍රව්‍ය හා උල් කටුය.

''කාර්යාලය'' යන්නට 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාලය සේවා නියුක්තිකයන් පිළිබඳ පනතේ (129 වන අධිකාරිය) දී ඇති අර්ථයම ඇත.

''සාප්පුව'' යන්නෙන් අදහස් කෙරෙන්නේ තොග හෝ සිල්ලර වෙළඳාම සඳහා භාණ්ඩ තබා ඇති ස්ථානයක් වන අතර ආහාර පාන අලෙවියට තබා ඇති ස්ථානයක් සහ බාබර් සාප්පුවක් හෝ රූපලාවන්‍ය සැලෝන් එකක් පවත්වාගෙන යනු ලබන ස්ථානද මීට ඇතුලත් වේ.

මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේ ය.

10 - 468/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.